*සැ. යු.–* 2007.05.18 දින පළවූ අංක 1498 දරන *ගැසට් පත්‍රයේ* II සහ III කොටස් පළ නොකරන ලදී.
මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2002 වර්ෂයේ මුද්‍රිත පොත් නාමාවලියේ ජනවාරි-මාර්තු කාර්තුව ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,499— 2007 මැයි 25 වැනි සිකුරාදා — 2007.05.25**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 460 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 465 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජූනි මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 මැයි මස 18 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිළධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලිම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

5. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතිරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රේදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු – ඇබෑර්තු

## ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව

01. නියෝජ්‍ය අධ්‍යක්ෂක (පරිපාලන තනතුර) **II** ශ්‍රේණිය

*සුදුසුකම්* .– පිළිගත් විශ්ව විද්‍යාලයක විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය හෝ විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ (විශේෂ) උපාධිය හෝ/විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂ) උපාධිය ;

*සහ*

අදාල ක්ෂේත්‍රයේ පශ්චාද් උපාධිය හෝ ඩිප්ලෝමා සුදුසුකම් ලබා තිබීම ;

*සමග*

අවුරුදු 05 කට නොඅඩු පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද ;

*හෝ*

පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යාවේ දී කළමනාකරණ උපාධිය සමග ලං. ජ. කා. අ. ආයතනයේ ලේඛකාධිකාරිවරයෙකු/මානව සම්පත් කළමනාකාරවරයෙකු ලෙස අවුරුදු 05ක සේවය කර ඇති අයෙකු වීම.

*වැටුප* .— රු. 20,490-325x10 + 475x5

02. ප්‍රධාන ඉංජිනේරු (මෝටර් කාර්මික ක්ෂේත්‍රය) - III "A" ශ්‍රේණිය
*සුදුසුකම්* .– පිළිගත් විශ්ව විද්‍යාලයක යාන්ත්‍රික ඉංජිනේරු උපාධිය සමග අදාල ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්ද ;

*හෝ*

ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (මෝටර් යාන්ත්‍රික ඉංජිනේරු) හා ඒ හා සමාන සහතිකයක් සමග වසර 10 ක පලපුරුද්ද ;

*හෝ*

ලං. ජ. කා. අ. ආයතනයේ පූර්ණකාලීන සහතිකය (මෝටර් කාර්මික) සමග අදාළ ක්ෂේත්‍රයේ විශේෂ පුහුණුවක් ලබා ඇති හෝ අදාල ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් ලබා අවුරුදු 15 ක පළපුරුද්ද,

පිළිගත් කාර්මික විද්‍යාලයක මෝටර් යාන්ත්‍රික විෂය ඉගැන්වීම පිළිබඳ පළපුරුද්ද ඇති අය සඳහා විශේෂයෙන් සලකා බලනු ලැබේ.
*වැටුප* .— 17,695-325 x 10 + 400 x 5

පහත සඳහන් කරුණු ද ඉහත තනතුරු සඳහා අදාල වේ. :—

01. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුයි.
02. අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තීන්ට අනුකූල විය යුතු අතර සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ලිවීමේ සහ කථා කිරීමේ මනා හැකියාවක් තිබිය යුතුය.
03. *වයස* .– අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාල නොවේ.
04. බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණ/ ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු පදනම් කර ගෙනය.
05. රජයේ හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින් ඔවුන්ගේ අයදුම්පත් අදාල ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතු ය.
06. තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ වැටුප ආදායම් බදුවලින් නිදහස් වන අතර සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% ක මුදලක් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා 3% ක මුදලක් ආයතනය මගින් දායක කරනු ලැබේ. ඊට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.
07. සුදුසුකම් ලත් අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්වල සේවා පළපුරුද්ද සඳහන් කළ යුතු අතර සම්පූර්ණ කළ අයදුම්පත් සමග අධ්‍යාපන/ වෘත්තීය සහතිකවල හා සේවා පළපුරුද්ද පිළිබඳ ඡායා පිටපත් ඇතුලත් විය යුතුය.
08. අයදුම්කරුවන් සපයා ඇති තොරතුරු සහතික කළ හැකි ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් දුරකථන අංකයන් ද සහිතව අයදුම් පතෙහි සඳහන් කළ යුතුය.
09. සියලුම අයදුම් පත් 2007.06.08 දිනට පෙර ලැබෙන සේ පහත ලිපිනයට එවිය යුතු අතර ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ කෙළවරෙහි සඳහන් කළ යුතුය.
10. අදාල සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පිරිස් කළමණාකාර,
ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය.

අංක 582, ගාලු පාර,
ගල්කිස්ස.

05-378

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

### පොලිස් කොස්තාපල් තනතුර - (විශේෂ කාර්යය බලකාය)

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ විශේෂ කර්යය බලකායට ආධුනික පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, දෙවන මහල, නව මහ ලේකම් ගොඩනැගිල්ල, කොළඹ 01 යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ උඩින් තමා අයදුම්කරන තනතුර "ආධුනික පොලිස් කොස්තාපල් තනතුර (විශේෂ කාර්යය බලකාය)" යනුවෙන් සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2007.08.25 දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :- ආධුනික පොලිස් කොස්තාපල් තනතුර (විශේෂ කාර්යය බලකාය)

රු. 1,66560 - 7 x 1,440 - 27x 1,800 - 2,25240

(*අ*) සියලුම නිළ ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(*ආ*) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(*ඇ*) රාජකාරී සඳහා ගමන් වියදම් දුෂ්කර සේවය හා විශිෂ්ඨ රාජකාරී සඳහා තෑගි වශයෙන් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

04. අවශ්‍ය මූලික සුදුසුකම් -

(*අ*) *වයස් සීමාව.– ගැසට් නිවේදනය* අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-25ත් අතර විය යුතුය.

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම්.–* අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුලුව එකවර විෂයයන් 06කින් සමත් විය යුතුය.

*සටහන 01 .–* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41,44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයක් ලෙස ද අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් වශයෙන් ද සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02 .–* අ.පො.ස. (සා.පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03 .–* වෛකල්පිත දෙමළ ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා.පෙළ) විෂය ධාරාවට ඇතුලත් නොවන හෙයින් එම විෂයන් සමත්වීම අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත් විෂයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(*ඇ*) ශාරීරික සුදුසුකම් :

* උස අඩි 05 අඟල් 04 (අවම)
* පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා)

*සටහන .–* විශිෂ්ඨ ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවලදී විශිෂ්ඨත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරඟයකට සහභාගී වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මදක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(*ඉ*) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්* :- එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතුය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතුය. යම් අපේක්ෂකයෙකු උපැස් යුවළක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(*ඊ*) අනෙක් සුදුසුකම් :

* අයදුම්කරු අවිවාහක විය යුතුය. (දික්කසාද වූවත් ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාල නොවේ.

* අවසාන තේරීම් මණ්ඩලයට ඉදිරිපත් වීමට ප්‍රථම අයදුම්කරුවන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණය, ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීමේ පරීක්ෂණය, ලිඛිත පරීක්ෂණය, හා අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් අයදුම්කරුවන් සමත් විය යුතුය. ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

* වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය කාලය විනාඩි 45කි.
* සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය කාලය පැය 01 යි.
* තෝරා ගන්නා ලබන අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය. පොලිස් සේවයට නුසුදුස්සන් යැයි පිළිගනු ලබන්නවුන් බඳවා ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. *පත්වීමේ කොන්දේසි* -

05.1 මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

06. *සේවා කොන්දේසි* -

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වේතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතුය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවෙනි සහ දෙවෙනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වේතොත් ඒවාට ද යටත් විය යුතුය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත්විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරී කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ වසර 01ක් ද ප්‍රාදේශීය පුහුණුව වසර 02ක් ද වනු ඇත.

(ඊ) පත්කර ගනු ලැබූ නිලධාරීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් ගැසට් 11 අංක 41 දරන නිවේදනය අනුව අවම වශයෙන් අවුරුදු 02ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(උ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබූ දින සිට අවුරුදු 03ක පරිවාස සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කල යුතු වන අතර මෙම පරිවාස සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිළ ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදුවූ අනෙකුත් වියදම් ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වන වෙලුමෙහි ආයතන සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතුය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන් (විශේෂ කාර්ය බලකාය) පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කල වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන් (විශේෂ කාර්යය බලකාය) පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කල වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතුය.

(ඒ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන් (විශේෂ කාර්යය බලකාය) පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

07. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වෙනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

08. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.)

(අ) උප්පැන්න සහතිකය ;
(ආ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක් (ඥාතීන් නොවන) ;
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික ;
(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික ;

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික (තිබේ නම් පමණක්) ;
(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

09. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කල යුතුය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කල යුතුය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත් අහල් 11x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරු වලින්ම සම්පූර්ණ කරනු ලැබූ අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිළධාරියෙකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතුය.

10. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

සටහන - පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණ වලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

වික්ටර් පෙරේරා,
පොලිස්පති.

## පොලිස් දෙපාර්තමේන්තුව

## ආධුනික පොලිස් කොස්තාපල් තනතුර
## (විශේෂ කාර්ය බලකාය)

## ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරින්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය. :——————.

(ආ) නම (මුලකුරු සමග) :——————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

03. පියාගේ සම්පූර්ණ නම :——————.

04. අයදුම්කරු උපන් ස්ථානය:——————.

උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :——————.

පළාත:——————.

05. (අ) වර්තමාන ලිපිනය :——————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :——————.
(ඇ) ස්ථිර ලිපිනය:——————.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය හා මැතිවරණ කොට්ඨාශය :——————.

06. (අ) ජාතිය :——————.
(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :——————.
(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :——————.
* අයදුම්කරු :——————.
* අයදුම්කරුගේ පියා :——————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :——————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :——————.

07. උපන් දිනය :——————. (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

වයස (ගැසට් නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කරන දිනට)

අවුරුදු:——————. මාස:——————. දින:——————.

08. උස :——————. පපුව:——————.

09. අධ්‍යාපන සුදුසුකම් - (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතික වල පිටපත් ඇමිණිය යුතුය) :———————.

10. විවාහක/අවිවාහක බව :———————.

11. (අ) දැනට කරන රැකියාව :———————.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද? :———————.

12. ඔබට විශේෂ දක්ෂතාවන් සහ/හෝ සුදුසුකම් තිබේ ද? :———————.

13. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්.

(අ) :———————.
(ආ) :———————.

14. (අ) ඔබ පොලිස් උප සේවයේ හෝ නිත්‍ය පොලිස් සේවාවේ තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම් කර තිබේ ද ?
(එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න.) :———————.

(ආ) ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සේවය කර තිබේද ?
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———————.

15. ඔබ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සාමාජිකයෙක් ද ? (එසේ නම් පත්වීමේ දිනය, නිලය, නිල අංකය සඳහන් කරන්න.) පත්වීමේ ලිපියේ පිටපතක් අමුණන්න.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———————.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුනන්න.:———————.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———————.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද? එසේ නම් අස්වීමේදී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :—————.

18. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———————.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :———————.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———————.
අයදුම්කරුගේ අත්සන

දිනය :———————.

05-438

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය

### ජාතික ක්‍රීඩා විද්‍යායතනය මගින් පවත්වනු ලබන ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2007 වර්ෂය

ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ක්‍රීඩා විද්‍යායතනය මගින් සිංහල භාෂාවෙන් පවත්වනු ලබන ක්‍රීඩා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා වයස අවුරුදු 18-35 අතර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*සටහන.–* 01. දැනට රජයේ සේවයේ නියුක්තව සිටින්නන්ට මෙම වයස් සීමාව බලපාන්නේ නැත.
02. මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී නියමිත පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් අවලංගු කිරීමට සිදු වේ.

*සුදුසුකම්.–*

02.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයේ දී හෝ ඊට සමාන පරීක්ෂණයකදී, දෙවතාවකට නොවැඩිව පෙනී සිටීමකින් විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. එසේ වුවද, සාමාර්ථය ලබා සිටිනන විෂයයන් 06 න් 02 ක් සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය හෝ අංක ගණිතය විය යුතුය.

02.2 තවද, ඔහු හෝ ඇය,

(අ) ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ රජයේ පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් හය මසක පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය.

*නැතහොත්* ;

(ආ) ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශයේ හෝ පළාත් සභාවලට අනුයුක්ත කොට ඇති ක්‍රීඩා නිලධාරියෙකු හෝ නිලධාරිනියක වශයෙන් වසරක සේවයක් සපුරා තිබීම හෝ පාසැල් ක්‍රීඩා ගුරුවරයෙකු හෝ ගුරුවරියක වශයෙන් හෝ පළාත් පාලන අයාතනයක ක්‍රීඩා පිළිබඳ උපදේශකවරයෙකු හෝ උපදේශකවරියක වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 05 ක පළපුරුද්දක් සහිතව ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශේෂ දක්ෂකම් දක්වා තිබිය යුතු ය.

*නැතහොත්* ;

අධ්‍යාපන විද්‍යාපීඨ, ශෘරීරික අධ්‍යාපන පාඨමාලාව සමත් වී තිබුන ද අධ්‍යාපන අමාත්‍යාංශයේ වසර පහක සේවා කාලය අනිවාර්ය වේ.

*නැතහොත්* ;

(ඇ) යුධ, නාවික හෝ ගුවන් හමුදා පුහුණු කිරීමේ පාසැලක ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ අවම වශයෙන් මාස 03 ක පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඈ) කිසියම් ක්‍රීඩාවක් සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයෙකු වශයෙන් කිසියම් අන්තර් ජාතික ක්‍රීඩා තරගයකට සහභාගි වී තිබිය යුතුය.

*නැතහොත්* ;

(ඉ) ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන, ජාතික මහා ක්‍රීඩා උළෙලේ තනි ඉසව් සඳහා පළමු, දෙවන, තෙවන ස්ථාන දිනා තිබීම හෝ කණ්ඩායම් තරගවලදී පළමු, දෙවන ස්ථාන දිනා තිබීම හෝ එම උළෙලේ දිස්ත්‍රික් තරගයකදී තනි ඉසව් සඳහා පළමු හෝ දෙවන ස්ථාන හෝ කණ්ඩායම් තරගයකදී නම්, පළමු ස්ථානය ද දිනාගෙන තිබීම හෝ ක්‍රීඩා සම්මේලනයකින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරගයකදී පළමු, දෙවන හෝ තෙවන ස්ථාන හෝ ජාතික තරගයකදී පළමු, දෙවන හෝ තෙවන ස්ථාන හෝ ජාතික තරගයකදී පළමු, දෙවන, තෙවන ස්ථාන ලබා තිබීම. (ප්‍රසිද්ධ පාසැල් හෝ ජාතික ශූරතාවය දිනා ඇත්නම්, එය අවු. 15 න් ඉහළ තරග වලදී විය යුතුය)

*අයදුම්පත් එවීමේ ක්‍රමය.–*

03.1 ඉහත සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් හෝ අපේක්ෂිකාවන් විසින් මෙම නිවේදනය අවසානයේ සඳහන් වන ආර්ශ අයදුම්පත්‍රය පරිදි 8" x 13 1/2 " ප්‍රමාණයේ කඩදාසියක සකස් කරගත් අයදුම්පත් තම අත් අකුරින් සම්පූර්ණ කර 2007.06.15 වැනි දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යායතනය, අංක 100/07 නිදහස් මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

03.2 අයදුම්පත බහා එවන කවරයේ වම් කෙළවරේ “2007 ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත” යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

03.3 රජයේ, පළාත් පාලනන සේවයේ, සංස්ථා සේවයේ නියුතු නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්, අදාල දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

4. *තෝරා ගැනීම.–* මේ සඳහා ලැබෙන අයදුම්පත් අතුරින් සුදුසුකම් ලබා ඇති සියලු දෙනා ලිඛිත පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, ඉන් සමත් වන අය සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට කැඳවීමෙන් පසුව පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

5. පාඨමාලාව පිළිබඳ විස්තර

05.1 විෂය නිර්දේශය පහත සඳහන් පරිදි කොටස් 05කින් යුක්තය.

(අ) පුහුණුවීමේ සාමාන්‍ය සිද්ධාන්ත (කායික ගුණාංග හා හැකියාවන්, තාක්ෂණ ක්‍රම, උපාය මාර්ග, පුහුණුවීමේ ක්‍රම, සැලසුම් කිරීමේ ක්‍රම, භාරය හා පරීක්ෂණ පිළිබඳ මූලධර්ම ආදී වශයෙනි)

(ආ) අවම වශයෙන් ක්‍රීඩා 10ක් පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික දැනුම

(ඇ) ජවන හා පිටිය මලල ක්‍රීඩා පිළිබඳ විශේෂඥතාවය

(ඈ) ජවන හා පිටිය මලල ක්‍රීඩා වලට අමතරව ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා කාලය තුල ගැහැණු අය හෝ පිරිමි අය සඳහා අවස්ථාවෝචිත පරිදි තෝරා ගන්නා ලද එක් ක්‍රීඩාවක් පිළිබඳ විශේෂඥතාවය.

(ඉ) ක්‍රීඩා කායික විද්‍යාව හා සමාජ විද්‍යාව, ක්‍රීඩා පරිපාලනය, ක්‍රීඩා උත්සව සංවිධානය ක්‍රම සහ ක්‍රීඩා මනෝ විද්‍යාව වැනි පොදු විෂයයන් අධ්‍යයනය කිරීම.

05.2 පාඨමාලාවේ කාලසීමාව මාස 12කි. (අවස්ථාවෝචිත පරිදි කාලසීමාව වෙනස් කිරීමට ඉඩ ඇත)

05.3 මෙම පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන, රැකියා විරහිත අයදුම්කරුවන් විසින් රු. 6,000ක මුදලක් ද, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා හෝ පළාත් සභාවල රැකියාවන් හි නිරත අයදුම්කරුවන් විසින් පෞද්ගලිකව හෝ ආයතන මගින් රු. 10,000 ක මුදලක් ද, පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. මෙම මුදල කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

05.4 පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලබන අය, ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ නීති හා රෙගුලාසි පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

05.5 පාඨමාලාව සාර්ථකව නිම කරන අයට ක්‍රීඩා පිළිබඳ ඩිප්ලෝමා සහතික පත්‍ර ප්‍රදානය කරනු ලැබේ.

6. *අනෙකුත් කොන්දේසි.–*

06.1 පාඨමාලාව අවසානයේ දී රැකියාවක් ලබාදීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

06.2 එතෙකුදු වුවත්, පාඨමාලාව හදාරන්නන් විසින් ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ අධ්‍යක්ෂ සමග ගිවිසුමකට එළඹිය යුතු යැයි මෙම අමාත්‍යාංශය අදහස් කරන්නේ නම්, එම ගිවිසුමට එළඹීමට පාඨමාලාව හදාරන්නන් බැඳී සිටිය යුතුය.

06.3 මෙහි ආවරණය නොවන අනිකුත් කරුණක් වේ නම්, ඒ සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ අධ්‍යක්ෂ, සිය අභිමතය පරිදි කටයුතු කරනු ඇත.

එස්. ලියනගම,
ලේකම්.

ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය,
අංක 33, ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 07,
2007 මැයි මස 07 වැනි දින.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2007 වර්ෂය**

01. (i) සම්පූර්ණ නම :____________. මයා/මිය/මෙනවිය
(ii) මුලකුරු සමග නම :____________.
(iii) ජාතික හැඳුනුම්පත් අංකය:____________.

02. ලිපිනය (i) පෞද්ගලික :____________.
(ii) කාර්යාලීය :____________.

03. උපන් දිනය වර්ෂය :——————. මාසය :——————. දිනය :——————.
2007.06.15 දිනට වයස : වර්ෂ:——————. මාස:——————. දින:——————.

04. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? නැතිද? යන වග :____________.
පුරවැසියෙක් නම්, ලියාපදිංචි වීමෙන් ද? පරම්පරාවෙන් ද? යන වග :____________.

05 (i) ස්ත්‍රී/පුරුෂ භාවය :——————.
(ii) විවාහක/අවිවාහක බව :——————.

06. ඔබ රැකියාවක් කරයි ද? නොකරයිද? යන වග :——————.
දැනට දරන තනතුර :——————.
රැකියාවේ සේවා කාලය :——————.

07. ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් ඩ

| *වර්ෂය* | *විභාගය* | *විෂයයන්* | *ලබා ඇති සාමාර්ථයන්* |
|---|---|---|---|
| | | | |

08. ක්‍රීඩා කුසලතාවයන් (ලබා ඇති සහතික හා විශේෂ දස්කම් පිළිබඳ මෙහි සටහන් කරන්න) :——————.

09. (i) ගැසට් නිවේදනය අනුව ඔබ මෙම පාඨමාලාවට සුදුසුකම් ලබන්නේ ඉහත 2.2 අ, ආ, ඇ. ඈ, ඉ දක්වා වන ජේද වලින් කුමන ජේදය යටතේ ද?:——————..

(ii) අදාල ජේදය යටතේ ඔබ ලබා ඇති සුදුසුකම් විස්තර සහිතව සඳහන් කරන්න :——————.

10. වෙනත් විශේෂ කරුණු :——————.

11. මෙම පාඨමාලාවට තෝරාගනු ලැබුවහොත්, රු. 6,000 ක හෝ රු. 10,000 ක මුදලක්, පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවීමට ඔබ සූදානම් ද, වන වග:——————.

මෙහි ඉහත මා විසින් දක්වා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මම සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ වැරදි හෝ බව යම්කිසි අයුරකින් සොයාගනු ලැබුවහොත් මෙම පාඨමාලාව හැදෑරීමට නුසුදුස්සෙකු වන බව හා පුහුණු පාඨමාලාවෙන් ඉවත් කරනු ලබන බව මම දනිමි.

____________.
අයදුම්කරුගේ අත්සන

දිනය :——————.

රජයේ පළාත් පාලන සේවයේ හා සංස්ථා සේවයේ නියුක්ත වූවන් සඳහා පමණි.

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යායතනය.

මෙම ........................................ සේවය කරන ........................................ වන ........................................මහතා/මහත්මිය/මෙනවියගේ අයදුම් පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරන අතර, මෙම අයදුම්කරු ඉහත පාඨමාලාව සඳහා තෝරාගනු ලැබුවහොත් පාඨමාලා කාලය සඳහා ඔහුව/ඇයව සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කරමි.

____________.
සහතික කරන නිලධාරියාගේ අත්සන.

නිල මුද්‍රාව :——————. නම :——————.
දිනය :——————.
05-401

## සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### සත්ව පාලන දෑවුරුදු ඩිප්ලෝමාව

මෙම දෙපාර්තමේන්තුව විසින් පවත්වන දෑවුරුදු සත්ව පාලන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා සිසුන් බඳවා ගැනීම පිණිස ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. *ඩිප්ලෝමා පාඨමාලාවේ විස්තර .–*

1.1 මෙම පාඨමාලාව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

1.2 මෙම ඩිප්ලෝමා පාඨමාලාව වෘත්තීය පුහුණු වැඩ සටහනක් වන අතර, මෙම පුහුණුව ලැබීමෙන් පසුව ස්වයං රැකියාවල නිරත වීම හෝ සුදුසු රැකියාවක් ලබා ගැනීම අරමුණ වේ. පුහුණුවෙන් පසු රැකියා ලබා දීමට මෙම දෙපාර්තමේන්තුව බැඳී නැත.

1.3 පුහුණුව ලබන කාලය තුළ දී සිසුන්ට නේවාසික පහසුකම් ලබාදෙන අතර, ආහාරපාන සිසුන් විසින් සපයා ගත යුතුව ඇත.

1.4 සෙනසුරාදා දිනවල ද සමහර විට පන්ති පවත්වන බැවින්, නේවාසිකාගාර වලින් බැහැරව යවන්නේ මසකට එක් සති අන්තයකදී පමණි.

02. *බඳවා ගැනීම.–* පුහුණුවන්නන් තෝරාගනු ලබන්නේ ලිඛිත සහ සම්මුඛ පරීක්ෂණ මඟිනි. ලිඛිත පරීක්ෂණ සඳහා පහත සඳහන් විෂයයන් යටතේ එක් ප්‍රශ්න පත්‍රයකට පැයක කාලය බැගින් ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතුය.

(i) *සත්ව පාලනය.–* අ. පො. ස (සා. පෙළ) කෘෂිකර්ම විෂය නිර්දේශයේ සත්ව පාලනය කොටසට අදාළව සකස් කරන බහුවරණ හා කෙටි ප්‍රශ්න අඩංගු වේ.

(ii) සාමාන්‍ය දැනීම

(iii) *ඉංග්‍රීසි.–* අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි විෂය නිර්දේශය ඇසුරින් ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ.

03. *ඇතුළත්වීම සඳහා අවම සුදුසුකම්.–*

3.1 අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

3.2 අයදුම්කරුවන් 2007.06.25 වැනි දිනට වයස අවුරුදු 17 ට නොඅඩු සහ 25 ට නොවැඩි විය යුතුය. (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

3.3 පහත සඳහන් අවම අධ්‍යාපන සුදුසුකම් අවශ්‍ය වේ :

3.3.1 භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට ද සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී එකම අවස්ථාවකදී සමත් වී තිබීම ; සහ

3.3.2 භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විෂයයන් ගෙන් විෂයයන් දෙකක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එක් අවස්ථාවකදී ම සමත් විය යුතුය. අ. පො. ස (උ. පෙළ) සඳහා ගණිතය විෂය ධාරාව හැදෑරූ අයට මෙම පාඨමාලාව සඳහා අයදුම් කළ නොහැක.

3.3.3 ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හදාරන්නේ නම්, අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සමාර්ථයක් තිබිය යුතුය.

අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතුය. අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා නැති ඉල්ලුම්පත් භාරගනු නොලැබේ. සියලුම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

04. යම් අයදුම්කරුවෙකු විසින් අසත්‍ය තොරතුරු සපයා ඇති බැව් තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත්, ඔහුගේ ශිෂ්‍යභාවය වහාම අත්හිටවනු ලැබීමට යටත්වනු ඇත. තවද, ඔහුගේ පුහුණුව සඳහා රජය මගින් ඒ වන විට දරා ඇති සියලුම වියදම් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට ගෙවීමට ද ඔහු බැඳී සිටින්නේ ය. වියදම් ප්‍රමාණය කොතෙක්දැයි තීරණය කිරීමේ අයිතිය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුය.

05. ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තුවන්නන් පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් ඉල්ලුම් පත්‍ර 2007.06.25 වැනි දිනට ප්‍රථම ලැබෙන සේ "අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, පේරාදෙණිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. විභාග ගාස්තු වශයෙන් "සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්" නමට නිකුත් කළ පේරාදෙණිය තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වන සේ ලබා ගත් රු.150 ක මුදල් ඇණවුමක් ද, ඉල්ලුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "සත්ව නිෂ්පාදන ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුළත්වීම" සහ තමන්ගේ දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත්‍ර අයදුම්කරුගේ අත් අකුරින් පිරවිය යුතුය.

06. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍ය සුදුසුකම් නොමැති ඉල්ලුම්පත් අයදුම්කරුවන්ට දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

වෛද්‍ය එස්. කේ. ආර්. අමරසේකර,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2007 ක් වූ මැයි මස 25 වැනි දින,
පේරාදෙණිය,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දී ය.

### ඉල්ලුම් පත්‍රය

### සත්වපාලන දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව

| විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍ය : | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :—————.
02. භාවිතයේ යෙදෙන අයුරු මුලකුරු සමග නම :—————.
03. ලිපිනය :—————.
04. දිස්ත්‍රික්කය :—————.
    මැතිවරණ කොට්ඨාසය :—————.
05. උපන් දිනය: අවුරුද්ද :—————. මාසය :—————..දිනය :—————.
06. 2007.06.25 වැනි දිනට වයස : අවුරුදු :—————. මාස:—————. දින :—————.
07. ඉල්ලුම්කරු අවසන් වරට පෙනී සිටි විභාගය :—————.
08. (i) අ. පො. ස (සා. පෙළ) සමත් විෂයයන් :

| විෂයයන් | සාමාන්‍ය/සම්මාන/විශිෂ්ඨ හෝ ශ්‍රේණිය | වර්ෂය | විභාග අංකය |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |
| 8. | | | |

(ii) අ. පො. ස. (උසස් පෙළ) සමත් විෂයයන් :

| විෂයයන් | සාමාන්‍ය/සම්මාන/විශිෂ්ඨ හෝ ශ්‍රේණිය | වර්ෂය | විභාග අංකය |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

(අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතුය. අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා නැති ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.)

09. මුදල් ගෙවූ තැපැල් කාර්යාලය හා මුදල් කුවිතාන්සි අංකය :—————.
10. අවසන්වරට අධ්‍යාපනය ලැබූ පාසල/ආයතනය :—————.
11. පාසැලෙන් /ආයතනයෙන් අස් වූ දිනය :—————.
12. සත්ව පාලනය පිළිබඳ දැනට ලබා ඇති පළපුරුද්ද (සහතික පිටපත් ඇමිණිය යුතුය.) :—————.
13. ග්‍රාම සංවර්ධන/කෘෂි කාර්මික/සමාජ සේවා/ක්‍රීඩා පිළිබඳ පළපුරුද්ද (සහතික පිටපත් ඇමිණිය යුතුය.) :—————.
14. ඔබ පාඨමාලාව හැදෑරීමට කැමති මාධ්‍ය : (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) :—————.
15. අයදුම්කරුගේ යෝග්‍යතාවය පිළිබඳ විමසිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :

    1. :—————.
    2. :—————.

ඉහත දැක්වෙන විස්තර මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය වූ ද, නිවැරදි වූ ද, තොරතුරු බව මෙයින් සහතික කරන අතර, යම් ලෙසකින් මා මෙම පුහුණුවට තෝරාගත් පසු අසත්‍ය තොරතුරක් හෙළිදරව් වුවහොත්, මගේ ශිෂ්‍යභාවය අත්හිටුවීමට හැකි බවද, පුහුණුව ලබන කාලයේදී මා වෙනුවෙන් රජයට යම් මුදලක් දැරීමට සිදු වී නම්, එම මුදල ආපසු ගෙවීමට මම බැඳී සිටින බව ද දනිමි.

____________.
අයදුම්කරුගේ අත්සන.

දිනය :____________.

*සටහන්*.– පහත විස්තර කරන සහතිකවල පිටපත් අමුණා ඇත :

1.
2.
3.

05-432

---

## විදේශ කටයුතු අමාත්‍යාංශය

### විදේශයන් හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සියරට පේරුවේ පෞද්ගලික සහකාර තනතුරු සඳහා පුරප්පාඩු පිරවීමේ විවෘත තරඟ විභාගය - 2007/2008

විදේශයන් හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සියරට පේරුවේ පෞද්ගලික සහකාර තනතුරු සඳහා ඉංග්‍රීසි ලඝු ලේඛනය හා පරිගණක කටයුතු කිරීමේ හැකියාව ඇති රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයෙන් හා පළාත් පාලන, සංස්ථා/රාජ්‍ය බැංකු හා වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල වැනි අර්ධ රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශයේ සේවයේ නියුක්තයන්ගෙන් ඉහත දැක්වෙන තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. *යෝග්‍යතාවය* :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු වන අතර, විවාහක නම් කලත්‍රයා ද ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට වයස අවුරුදු 55ට නොවැඩි වූ ද, ඉංග්‍රීසි ලඝු ලේඛනයේ හා පරිගනක කටයුතු පිළිබඳ හැකියාව ඇති යටත් පිරිසෙයින් අවුරුදු 05 ක ස්ථිර සේවා කාලයක් සපුරා සිටින්නා වූ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ හා පළාත් පාලන සේවයේ ස්ථිර සේවාදායකයන් වීම.

(iii) ඉල්ලුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට වයස අවුරුදු 55ට නොවැඩි ඉංග්‍රීසි ලඝු ලේඛනය හා පරිගනක හැකියාව ඇති, යටත් පිරිසෙයින් අවුරුදු 05ක පළපුරුද්දක් ඇත්තා වූ සංස්ථා, රාජ්‍ය බැංකු, වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල වැනි අර්ධ රජයේ ආයතනවල සහ පෞද්ගලික අංශයේ සේවයේ නියුතු වීම.

*සටහන* : (i) දැනට විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය කරන අය මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුසු නොවෙත්.

(ii) ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කලින් සේවය කර නැවත ශ්‍රී ලංකාවට පැමිණි නිලධාරීනට ද ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය හැක. එසේ වුවද දූත මණ්ඩලවලට පත්වීම් කිරීමේදී ප්‍රමුඛතාවය දෙනු ලබනුයේ අඩු තරමින් එසේ පැමිණ මාස දොලහක කාල පරිච්ඡේදයක් ශ්‍රී ලංකාවේ සේවයේ යෙදී ඇති අයදුම්කරුවන් හටය.

3. *තෝරා ගැනීමේ ක්‍රමය* :

3.1 අයදුම්කරුවන් ඉංග්‍රීසි ලඝුලේඛනය පිළිබඳ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම පරීක්ෂණය කොළඹ දී පවත්වන අතර, පරීක්ෂණ මාධ්‍ය ඉංග්‍රීසි වේ. මෙම පරීක්ෂණයට නියමිත ලඝු ලේඛන වේගය මිනිත්තුවට වචන 80කි. මෙම පරීක්ෂණයෙන් 40%ක් හෝ ඊට වැඩියෙන් හෝ ලකුණු ලබාගත් අයදුම්කරුවන් පරිගණක සාක්ෂරතාවය පිළිබඳ පරීක්ෂණයකට සහ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට කැඳවනු ඇත. එසේ ද වුවත්, ලිඛිත පරීක්ෂණයෙන් ඉහත කී ලකුණු මට්ටම් සහිත සුදුසුකම් ලත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් ඊට අඩු ලකුණු ප්‍රමාණ ලබාගත් අපේක්ෂකයන් ද සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ අයිතිය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සතුවනු ඇත.

3.2 පරීක්ෂණයට වෙන් කරන ලකුණු පහත පරිදිය ;

| | | |
|---|---|---|
| (අ) ඉංග්‍රීසි ලඝු ලේඛනය | – | ලකුණු 100 |
| (ආ) දත්ත සමුදාය කළමනාකරණය ඇතුළත් පරිගණක සාක්ෂරතාවය (ලිඛිත පරීක්ෂණය) | – | ලකුණු 50 |
| (ඇ) දත්ත සමුදාය කළමනාකරණය ඇතුළත් පරිගණක සාක්ෂරතාවය (ප්‍රායෝගික පරීක්ෂණය) | – | ලකුණු 50 |

3.3 ලිඛිත විභාගයේ ප්‍රමුඛතාවය පදනම් කරගෙන තෝරාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ඇත. කෙසේ වෙතත් මෙම පත්වීම් විදේශ කටයුතු ලේකම්ගේ අභිමතය පරිදි සිදු කරනු ඇත.

4. *සේවය භාරගැනීම පිළිබඳ කොන්දේසි :*

4.1(අ) තෝරාගනු ලබන නිලධාරියෙකු, විදේශයක පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයක සේවයට පත් කිරීමට පෙර, මුලින්ම අවුරුදු දෙකකට නොවැඩි කාල සීමාවක් කොළඹ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කළ යුතුය. විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කරන මුල් කාල සීමාවේ දී ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම අසතුටුදායක බව පෙනී ගියහොත් ඔහුගේ/ඇයගේ තෝරා ගැනීම අවලංගු කිරීමට යටත් වන්නේය. අමාත්‍යාංශයේ සේවය කරන කාල සීමාව, අමාත්‍යාංශයේ අවශ්‍යතාවයට අනුව වෙනස් කළ හැකි වේ.

(ආ) තෝරාගනු ලබන නිලධාරීන් විදේශ දූත මණ්ඩලවලට පත් කිරීම තීරණය කරනු ලබන්නේ ඒ ඒ දූත මණ්ඩවල අවශ්‍යතා සහ නිලධාරියාගේ යෝග්‍යතාවය සහ දක්ෂතාවය (විදේශ භාෂා දැනුම ආදිය) මතය. මෙම පත් කිරීම් සිදු කිරීමේදී නිලධාරියාගේ පෞද්ගලික අවශ්‍යතා සහ දුක් ගැනවිලි (දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ආදිය) සලකා බැලීමට විදේශ කටයුතු අමාත්‍යාංශය බැඳී නොමැත. තව ද, තේරීමේ පරීක්ෂණවල ලකුණු අනුපිළිවෙලට අනුකූලව පුරප්පාඩු පිරවීමට මෙම අමාත්‍යාංශය කිසිසේත් බැඳී නැත.

(ඇ) තෝරාගනු ලබන නිලධාරියෙකු විදේශයක ශ්‍රී ලංකා දූත මණ්ඩලයකට පත් කිරීමේ දී විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිගමනය කරනු ලබන නියම හා කොන්දේසි මත තුන් අවුරුදු කාලසීමාවක් විදේශයන් හි සේවය කළයුතු අතර, ඒ බවට ගිවිසුමකට එළැඹිය යුතු ය.

4.2 සංස්ථා, රාජ්‍ය, බැංකු වලින්, ව්‍යවස්ථාපිත මණ්ඩල වලින් සහ පෞද්ගලික අංශයෙන් තෝරා ගන්නා අයදුම්කරු/කාරිය හට (මුලින් අවුරුදු 02ක් අමාත්‍යාංශයේ ද, අවුරුදු 03ක් දූත මණ්ඩලයක ද වශයෙන්) අවුරුදු 05ක ගිවිසුම් කාලසීමාවක් සේවය කිරීමට සිදුවේ. එසේ වුවත්, සේවා අවශ්‍යතාවලට අනුව විදේශ කටයුතු අමාත්‍යාංශයේත්, විදේශයේ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයේත් සේවය කරන කාලය වෙනස් විය හැකිය. පස් අවුරුදු ගිවිසුම් කාලසීමාව අවසන් වීමෙන් අනතුරුව ඔවුන් කලින් පැමිණි ආයතන වෙත මුදා හරිනු ලැබේ.

4.3 රාජ්‍ය කළමනාකරණ /පළාත් රාජ්‍ය / පළාත් පාලන සේවා නිලධාරීන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන්ගේ වර්තමාන වැටුප් ක්‍රමය මත වැටුප් ගෙවනු ලැබේ. සෙසු නිලධාරීන්ට මසකට රු. 14,980 ක් වූ ස්ථිර වැටුපක් ගෙවනු ලැබේ.

මීට අමතර වශයෙන්, ඔවුන් විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය කරමින් සිටින කාලය තුළ බලපැවැත්වෙන නීති හා රෙගුලාසි අනුව විදේශ දීමනාවක් ද ගෙවනු ලැබේ.

4.4 තෝරා ගනු ලබන නිලධාරියෙකු විදේශයක පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයකට පත්කර යවන විට, එම නිලධාරියාත්, ඔහුගේ/ඇයගේ කලත්‍රයාත්, සුදුසුකම් ඇති දරුවන් දෙදෙනෙකුත් සඳහා පමණක්, පත්වීම ලත් රටට යාමටත්, ආපසු ඒමටත්, යාන පත්‍ර හා නවාතැන් සඳහා පිරිවැය, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරන වෙනත් දීමනා ද රජයේ වියදමින් දරනු ලැබේ. (මේ වගන්තියේ කාර්යය සඳහා සුදුසුකම් ඇති දරුවන් වන්නේ වයස අවුරුදු 21ට අඩු අවිවාහක දරුවන් වේ)

5. *අයදුම් කරන පිළිවෙල :*

5.1 මුද්‍රිත අයදුම්පත් නිකුත් කරනු නොලැබේ. ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරගත්, මෙම නිවේදනයට අමුණා තිබෙන ආදර්ශ ආකෘති පත්‍රයට අනුව අපේක්ෂකයන් ඔවුන්ගේ අයදුම්පත් තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. විදේශ සේවය සඳහා අයදුම්කරු/අයදුම්කාරියගේ යෝග්‍යතාවය ගැන ද, එම අයදුම්කරු/අයදුම්කාරිය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය වර්තමානයේ දරන තනතුරින් වහාම මුදාහල හැකි බවට ද, අයදුම්පතේ දැක්වෙන තොරතුරු නිවැරදි බවට ද ආයතන ප්‍රධානියාගෙන් සටහනක් සෑම අයදුම්පතකම තිබිය යුතුය.

5.2 අයදුම්පත 2007 ජුනි 25 වැනි දින හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙනු පිණිස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ " විදේශයන් හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල පුරප්පාඩු පිරවීම සඳහා සියරට පේරුවේ පෞද්ගලික සහකාර තෝරා ගැනීමේ විභාගය " යනුවෙන් සටහන් කොට තිබිය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ. තවද ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ (සෙ.මී. 2 x සෙ.මී. 2) ප්‍රමාණයේ කොටුවක් තුළ 'P' අකුර යෙදීම අනිවාර්යය වේ.

*විභාග ගාස්තු :*

6. විභාග ගාස්තු රු. 200 කි. මෙම ගාස්තු ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවිය හැකිය. මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය, අයදුම්පතේ අදාල කොටුවෙහි ඇලවිය යුතුය. (කුවිතාන්සි අංකය, දිනය සහ තැපැල් කාර්යාලය සඳහන් කළ යුතුය). කිසිදු හේතුවක් නිසාවෙන්, විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. විභාග ගාස්තු ගෙවීම සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ බාරගනු නොලැබේ.

7. නිසි ලෙස සම්පූර්ණ නොවූ අයදුම්පත් වෙතොත් ඒවා ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. අයදුම්පතක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ ඉදිරිපත් කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

8. අයදුම්පත ලැබුණු බව දැනුම්දෙනු නොලැබේ. සුදුසුයයි පිළිගන්නා අයදුම්පත් ඉදිරිපතක් කළ යෝග්‍ය අයදුම්කරුවන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රවෘත්ති පත්‍ර දැන්වීමක් පලකරනු ලැබේ.

පාලිත ටී. බී. කොහොන,
ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය.

විදේශ කටයුතු අමාත්‍යාංශය,
තැ.පෙ. 583,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 01,
2007 මැයි මස 11 වැනි දින.

## ආදර්ශ ආකෘති පත්‍රය 1

*විදේශයන් හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සියරට පේරුවේ පෞද්ගලික සහකාර තනතුරු සඳහා අයදුම් පත්‍රය*

*APPLICATION FOR POST OF HOME BASED PERSONAL ASSISTANTS IN SRI LANKA MISSIONS ABROAD*

(2 (ii) ඡේදය යටතේ අයදුම්කරන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සඳහා පමණි)

*"අ" කොටස*

විභාග අංකය :
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

01. (i) අයදුම්කරුගේ/කාරියගේ සම්පූර්ණ නම :————.
(ii) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.

02. ලිපිනය :
(අ) කාර්යාලයීය :————.
(ආ) පෞද්ගලික :————.
(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. (අ) උපන් දිනය :
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :————.
අවුරුදු :————. මාස :————. දින :————.

04. විවාහක/අවිවාහක තත්ත්වය :————.

05. විවාහක නම් කලත්‍රයාගේ නම සහ ඔහුගේ/ඇයගේ ජාතිය :————.

06. දරුවන් ගණන සහ ඔවුන්ගේ නම්, උපන් දිනයන් සහ වයස් :————.

07. කලත්‍රයා රැකියාවක යෙදේ නම් එම රැකියාව පිළිබඳ තොරතුරු (රාජ්‍ය නිලධාරියෙකු නම් සියලු විස්තර සඳහන් කරන්න)

08. අධ්‍යාපන සුදුසුකම් (මාධ්‍ය සඳහන් කරන්න) :————.

09. රාජ්‍ය/පළාත් රාජ්‍ය/පළාත් පාලන සේවාවල පළමු පත්වීම ලැබූ දිනය :————.

10. පත්වීම ස්ථිර කළ දිනය :————.

11. දැනට සිටින ශ්‍රේණිය සහ ඊට ඇතුලත්වූ දිනය :————.

12. දැනට ලබන වාර්ෂික වැටුප :————.

13. දැනට නියුක්ත වී සිටින රාජකාරියේ ස්වභාවය :————.

14. වේගය :————.
   (අ) ඉංග්‍රීසි ලඝු ලේඛනය :————.
   (ආ) ඉංග්‍රීසි යතුරු ලියනය :————.

15. ප්‍රවීණතාවය :————.
   (අ) ඉංග්‍රීසි භාෂාව :————.
   (ආ) සිංහල/දෙමළ භාෂාව :————.
   (ඇ) පරිගණක සාක්ෂරතාවය :————.
   (ඈ) වෙනත් විදේශ භාෂා :————.

16. අයදුම්කරු/අයදුම්කාරිය මීට පෙර විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය කර තිබේනම් එම දූත මණ්ඩල සහ දින වකවානු :————.

17. වෙනත් සුදුසුකම් ඇතොත් ඒවා :————.

18. *ගැසට් පත්‍රයේ දැක්වෙන පරිදි විභාග ගාස්තු සඳහා නියමිත මුදල තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙහි ඇලවිය යුතුයි.* :—

   (i) කුවිතාන්සි අංකය :————.
   (ii) තැපැල් කාර්යාලය :————.
   (iii) දිනය :————.
   (iv) මුදල් ප්‍රමාණය :————.

19. අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ සහතිකය :

..........................................ට වහාම පසුව එළඹි පස් අවුරුදු කාලය තුළ නියමිත සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අවවාද කිරීම් හැර කිසිදු ආකාරයක විනය දඬුවමකට භාජනය වී නැති බවත් මෙහි සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් හා මගේ විශ්වාසය අනුව නිවැරදි බවත් සත්‍ය බවත්, ප්‍රකාශ කරමි.

:————.
අයදුම්කරුගේ/කාරියගේ අත්සන

දිනය :————.

"ආ" කොටස

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**
**(දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පිරවීම සඳහා)**

අයදුම්කරු/අයදුම්කාරිය 2007.06.25 වැනි දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ (අ)..................................මයා/මිය/මෙනෙවිය ඔහුට/ඇයට නියමිත සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත් (ආ)අවවාද කිරීම් හැර, විනය දඬුවමකට ඔහු/ඇය භාජනය වී නැති බවත් සහතික කරමි.

අයදුම්පතේ සඳහන් කර තිබෙන විස්තර නිවැරදි බව සහතික කරමි.
මෙම නිළධාරියා/නිළධාරිනිය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් වහාම මුදාහල හැකිය..

:————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
දිනය :————.

B2 -B 079501

ආදර්ශ ආකෘති පත්‍රය II

*විදේශයන් හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සියරට පේරුවේ පෞද්ගලික සහකාර තනතුරු සඳහා අයදුම් පත්‍රය*

*APPLICATION FOR POST OF HOME BASED PERSONAL ASSISTANTS IN SRI LANKA MISSIONS ABROAD*

(2 (iii) ඡෙදය යටතේ අයදුම්කරන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සඳහා පමණි)

*"අ" කොටස*

| |
|---|
| විභාග අංකය :<br>(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි) |

01. (i) අයදුම්කරුගේ/කාරියගේ සම්පූර්ණ නම :————.
(ii) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.

02. ලිපිනය :
(අ) කාර්යාලයීය :————.
(ආ) පෞද්ගලික :————.

03. (අ) උපන් දිනය :
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :————.
අවුරුදු :————. මාස :————. දින :————.

04. විවාහක/අවිවාහක තත්ත්වය :————.

05. විවාහක නම් කලත්‍රයාගේ නම සහ ඔහුගේ/ඇයගේ ජාතිය :————.

06. දරුවන් ගණන සහ ඔවුන්ගේ නම්, උපන් දිනයන් සහ වයස් :————.

07. කලත්‍රයා රැකියාවක යෙදේ නම් එම රැකියාව පිළිබඳ තොරතුරු (රාජ්‍ය නිලධාරියෙකු නම් සියලු විස්තර සඳහන් කරන්න)

08. අධ්‍යාපන සුදුසුකම් (මාධ්‍ය සඳහන් කරන්න) :————.

09. අයදුම්කරු/අයදුම්කාරිය අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න පස් අවුරුද්ද තුළ දී සේවය කළ ආයතනවල නම් සහ සේවා කාල

| *ආයතනයේ නම* | *තනතුර* | *කාල සීමාව* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |
| | | | |
| | | | |

10. දැනට ලබන වාර්ෂික වැටුප :————.
11. දැනට නියුක්ත වී සිටින රාජකාරියේ ස්වභාවය :————.
12. වේගය :————.
(අ) ඉංග්‍රීසි ලඝු ලේඛනය :————.
(ආ) ඉංග්‍රීසි යතුරු ලිපිනය :————.

13. ප්‍රවීණතාවය
(අ) ඉංග්‍රීසි භාෂාව
(ආ) සිංහල/දෙමළ භාෂාව
(ඇ) පරිගණක සාක්ෂරතාවය
(ඈ) වෙනත් විදේශ භාෂා

14. අයදුම්කරු/කාරිය මීට පෙර විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය කර ඇත්නම් එම දූත මණ්ඩල සහ දින වකවානු :———.
15. වෙනත් සුදුසුකම් ඇතොත් ඒවා :————.

16. සටහන් :

*ගැසට් පත්‍රයේ දැක්වෙන පරිදි විභාග ගාස්තු සඳහා නියමිත මුදල තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙහි ඇලවිය යුතුය. :*

(i) කුවිතාන්සි අංකය :————.
(ii) තැපැල් කාර්යාලය :————.
(iii) දිනය :————.
(iv) මුදල් ප්‍රමාණය :————.

17. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සහතිකය :

මෙම අයදුම්පතේ සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, සත්‍ය බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෙළිදරව් වුවහොත් තෝරා ගැනීමට පෙර මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් වන්දියකින් තොරව සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් වන බවත් මම දනිමි.

————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

"ආ" කොටස

ආයතන ප්‍රධානියාගේ සහතිකය
(ආයතන ප්‍රධානියා විසින් පිරවීම සඳහා)

අයදුම්කරු/අයදුම්කාරිය වන ....................................මහතා/මිය/මෙනවිය ........................දින සිට මෙම ආයතනයේ සේවය කරමින් සිටින බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, මෙම කාර්යාලයේ පවතින වාර්තාවලට අනුව ඉහත සපයා තිබෙන විස්තර සත්‍ය බවත් 2007....................... වන දින මා ඉදිරිපිට දී අත්සන් තැබූ බවත් සහතික කරමි.

මෙම නිලධාරියා/නිලධාරිණිය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් වහාම මුදාහළ හැකි ය.

:————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
පදවි නාමය :————.
දිනය :————.
ලිපිනය :————.

05-446/1

---

## විදේශ කටයුතු අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවක පුරප්පාඩු පිරවීම සඳහා වූ තරග විභාගය

ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සියරට පේරුවේ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමට නිලධාරීන් තෝරාගනු පිණිස විදේශ කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පැවැත්වීමට නියමිත තරග විභාගය සඳහා, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ, පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සහ පළාත් පාලන කළමනාකරණ සහකාර සේවයේ සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතාවය* - අපේක්ෂකයකු පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :

(අ) අපේක්ෂකයා, රා. ක. ස. සේ I වැනි පංතියේ හෝ II වැනි පංතියේ නිලධාරියෙකු/නිලධාරිණියක, හෝ පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සහ පළාත් පාලන කළමනාකරණ සහකාර සේවයේ I වැනි පංතියේ හෝ II වැනි පංතියේ නිලධාරියෙකු/නිලධාරිණියක විය යුතුය.

(*ආ*) සියලු අයදුම්කරුවන් :

(i) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 55ට අඩු විය යුතුය.

(ii) අපේක්ෂකයා/අපේක්ෂිකාව අයදුම්පත ඉදිරිපත් කරන දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලසීමාව තුළ උපයාගත යුතු සියලු වාර්ෂික වැටුප් වර්ධක ඔහු/ඇය විසින් උපයාගෙන තිබිය යුතුය.

(iii) අවවාද කිරීම් හැර වෙනත් කවර ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට යටත්ව නොමැති විය යුතුය.

*සටහන* : (i) දැනටමත් ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල සේවයෙහි නියුතු නිලධාරීහු මෙම විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබති.

(ii) මින් පෙර ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයක සේවය කළ නිලධාරීන්ට ද ඉහත විභාගය සඳහා අයදුම්කළ හැකි අතර, ඒ සඳහා දූත මණ්ඩලයක ඔවුන් ලද අවසන් පත්වීම නිමකර ශ්‍රී ලංකාවට නැවත පැමිණීමෙන් පසු අවම වශයෙන් වසර 02ක කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

(iii) අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේ සුදුසුකම් සපුරාලන නිලධාරියෙකු ඉන් පසුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ/පළාත් රාජ්‍ය කලමනාකරණ සහකාර සේවයේ/පළාත් පාලන කළමනාකරණ සහකාර සේවයේ I වන පන්තියට වඩා උසස් පන්තියකට / ශ්‍රේණියකට උසස්වීමක් ලද්දේ නම් හෝ වෙනත් සේවාවක තනතුරකට පත්වීමක් ලද්දේ නම් හෝ එම අපේක්ෂකයා/අපේක්ෂිකාව ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයක සියරට පේරුවේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවාවේ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩුවක් පිරවීම සඳහා පත්කරනු ලැබීමට ඇති සුදුසුකම අවලංගු වේ.

තම වෘත්තීය තත්ත්වයේ වෙනසක් සිදුවීම මගින් මෙම ඡේදයේ (අ) වගන්තිය යටතේ තම සුදුසුකම්වලට බලපෑමක් ඇතිවිය හැකි අවස්ථාවක ඒ පිළිබඳව වහාම විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත අප්‍රමාදව දැනුම් දීම එවැනි අයදුම්කරුවෙකුගේ වගකීම වේ.

(iv) ගිණුම් හා ආයතන කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති සහ ඉංග්‍රීසි භාෂා/අනෙකුත් භාෂා (ලිවීම හා කථනය) පිළිබඳ ඉතා හොඳ දැනුමක් ඇති නිලධාරීන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. අනෙකුත් විදේශ භාෂා වලින් වැඩ කිරීමට ඇති හැකියාව අතිරේක සුදුසුකමක් සේ සැලකෙන අතර, එවැනි අයට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

03. තෝරා ගන්නා ක්‍රමය. - විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මත තෝරාගැනීම් සිදු කරනු ලැබේ. මෙම පරීක්ෂණය කොළඹ දී පවත්වනු ලැබේ.

3.1 *ලිඛිත පරීක්ෂණය* :-

ලිඛිත පරීක්ෂණය පහත ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වනු ඇති අතර, එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100 ලබාදෙනු ඇත.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* |
|---|---|
| ගිණුම් | පැය 02 යි |
| ආයතන හා කාර්යාල ක්‍රම | පැය 02 යි |
| ඉංග්‍රීසි | පැය 02 යි |
| සාමාන්‍ය දැනීම | පැය 01 යි |

*සටහන :-*

(i) *ගිණුම්* - රජයේ ආයතනයක මූල්‍ය කටයුතු හා ගිණුම් පටිපාටි පිළිබඳ අපේක්ෂකයා සතු ප්‍රායෝගික දැනුම මැනීම සඳහා ප්‍රශ්න පත්‍රය සැකසේ.

(ii) *ආයතන හා කාර්යාල ක්‍රම* - රාජ්‍ය ආයතනයක ආයතන කටයුතු හා කාර්යාල ක්‍රම පිළිබඳ අපේක්ෂකයා සතු ප්‍රායෝගික දැනුම මැනීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න සකස් කෙරේ.
අපේක්ෂකයන්ට තම අභිමතය පරිදි ප්‍රශ්න තෝරාගත හැකි වන සේ මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරෙනු ඇත.

(iii) *ඉංග්‍රීසි*-අවබෝධය සහ ලිඛිත සන්නිවේදනය පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ.

(iv) *සාමාන්‍ය දැනීම*- ශ්‍රී ලංකාවේ දේශපාලන, සමාජ සංස්කෘතික සහ ආර්ථික පසුබිම, ඉතිහාසය හා භූගෝලය මෙන්ම වර්තමාන ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්නපත්‍රය සමන්විත වනු ඇත. අපේක්ෂකයන් සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතු වන අතර, කෙටි පිළිතුරු සැපයීම ප්‍රමාණවත් වේ.

(v) පරිගණක දැනුම අතිරේක සුදුසුකමක් වනු ඇත.

3.2 *සම්මුඛ පරීක්ෂණය* :

3.2.1 සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම අවම ලකුණු 40%ක් සහ 200 හෝ ඊට වැඩි සමස්ථ ලකුණු ප්‍රමාණයක් ලබාගත් අපේක්ෂකයෝ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබීමට සුදුසුකම් ලබති. කෙසේ වුව ද, ලිඛිත පරීක්ෂණයේ දී ඉහත සඳහන් මට්ටම්වලට වඩා වැඩියෙන් ලකුණු ලබාගත් සුදුසුකම් ලද අපේක්ෂකයන් ප්‍රමාණවත් ප්‍රමාණයක් නොමැති නම් ඊට වඩා අඩු ලකුණු ඇති අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ අයිතිය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

3.2.1 සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ප්‍රමාණය ලකුණු 100ක් වනු ඇති අතර, එය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරන මඬුල්ලක් මගින් පවත්වනු ඇත.

4.සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි -

4.1 තෝරාගන්නා ලද නිලධාරියෙකු ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයකට පත් කරනු ලැබීමට පෙර අවම වශයෙන් වසර දෙකක නිශ්චිත කාල සීමාවක් සඳහා ඔහු/ඇය කොළඹ, විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කළ යුතුය. විදේශ කටයුතු අමාත්‍යාංශයේ මූලිකව සේවය කරන මෙම කාලය තුළ දී ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම අසතුටුදායක බව පෙනී ගියහොත්, ඔහුව/ඇයව තෝරාගනු ලැබීම අවලංගු කළ හැකිය.

4.2 ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයකට පත් කරනු ලබන නිලධාරියෙකු සාමාන්‍යයෙන්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නියම කරනු ලබන නියම හා කොන්දේසි මත වසර තුනක කාලයක් විදේශයක සේවය කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹිය යුතුවේ. අදාළ සේවා කාලය නිම කිරීමෙන් පසු නිලධාරියා අමාත්‍යාංශය වෙත නැවත පැමිණිය යුතුවේ. සේවා දීර්ඝ කිරීම් ලබා නොදෙයි.

4.3 තෝරාගත් නිලධාරීන්ට ඔවුන් වර්තමානයේ ලබන වැටුප තවදුරටත් හිමිවනු ඇති අතර, ඊට අතිරේකව විදේශයක සේවය කරන කාල සීමාව තුළදී දීමනාවක් ද ගෙවනු ඇත.

4.4 තෝරාගත් නිලධාරියෙකු ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයකට පත් කළ විට, ඔහු/ඇය විදේශ සේවාවේ නියැලෙන කාල සීමාව සඳහා පමණක් එම නිලධාරියා, ඔහුගේ/ඇයගේ කලත්‍රයා සහ සුදුසු දරුවන් දෙදෙනෙකු සම්බන්ධයෙන් පමණක්, අදාළ නිලධාරියා පත්කරන ලද රටට යාමට හා ඊමට ගුවන් යානා පත්‍ර, එම රටේ නවාතැන් සඳහා යන වියදම් සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරන අනෙකුත් දීමනා රජය විසින් දරනු ඇත.

(මෙම වගන්තියේ සඳහන් අරමුණ සඳහා සුදුසුකම් ලබන දරුවන් වනුයේ වයස අවුරුදු 21ට අඩු සහ නිලධාරියාගෙන් යැපෙන්නන්ය.)

5. *අයදුම්කරන ආකාරය* :

5.1 මුද්‍රිත අයදුම්පත් නිකුත් නොකෙරේ. අපේක්ෂකයන් මෙම දැන්වීමට අමුණා ඇති ආකෘති පත්‍රය පරිදි ඒ4 ප්‍රමාණයේ කොළයක අංක 1.0 සිට 5.1 දක්වාත්, අංක 6.0 සිට 13.0 දක්වා සහ ඉතිරි අංක 14.0 හා (ආ) කොටසත් පිළවෙලින් පළමුවැනි, දෙවැනි හා තෙවැනි පිටුවලත් ඇතුළත් වනසේ අයදුම්පත් සකසා ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. (ආ) කොටසේ සඳහන් කර ඇති පරිදි අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිර්දේශ අඩංගු නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. අයදුම්කරු විදේශ සේවය සඳහා සුදුසු බවටත්, අයදුම්කරු තෝරාගතහොත් ඔහු/ඇය වර්තමානයේ දරන තනතුරින් වහාම මුදාහැරිය හැකි බවටත් අයදුම්පත්‍රයේ දක්වා ඇති තොරතුරු නිවැරදි බවටත් සඳහන් කරමින් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කරන ලද සහතිකයක් සෑම අයදුම්පතකම අන්තර්ගත විය යුතුවේ.

5.2 අයදුම්පත් 2007.06.25 වැනි දින හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග අංශය, විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වන අතර, කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල පුරප්පාඩු සඳහා කළමනාකරණ සහකාර නිලධාරීන් තෝරාගැනීමේ විභාගය" යනුවෙන් සඳහන් කළ යුතුවේ. අවසන් දිනට පසුව ඉදිරිපත් කරන අයදුම්පත් භාරගනු නොලැබේ. තව ද ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ (සෙ. මී. 2 x සෙ. මී. 2) ප්‍රමාණයේ කොටුවක් තුළ 'M' අකුර යෙදීම අනිවාර්ය වේ.

6. විභාග ගාස්තු. - විභාග ගාස්තු රු. 300කි. මෙම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ 4000-20-03-20-13 දරන ආදායම් ශීර්ෂයට බැරවන සේ ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවිය හැකි වන අතර, ලදුපත අයදුම්පත්‍රයේ අදාල කොටුව තුළ ඇලවිය යුතුය. (ලදුපත් අංකය, දිනය, ගෙවන ලද මුදල සහ ගෙවන ලද තැපැල් කාර්යාලය ද සඳහන් කළ යුතුය.) වෙනත් ආකාරයකින් විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතක් හෝ මුද්දර හෝ තැපැල්/මුදල් ඇණවුම් හෝ බාර නොගැනේ. ලදුපතෙහි ඡායාස්ථිත පිටපතක් අයදුම්කරු ළඟ තබාගැනීම යෝග්‍යවේ. විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

7. සෑම අයුරින්ම සම්පූර්ණ නොවූ කවර හෝ අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ හැකිය. තැපෑලේ දී නැතිවන හෝ ප්‍රමාදවන අයදුම්පත්‍රයක් පිළිබඳ පැමිණිලි සලකා බලනු නොලැබේ.

8. විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර :

8.1 අයදුම්පත ලැබුණු බවට දන්වනු නොලැබේ. අයදුම්පත් ලැබුණු අනුපිළිවෙල අනුව අයදුම්කරුවන් විභාගයට කැඳවනු ඇත.

8.2 ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කරන සියළුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවෙකු සහතික කරන ලද අත්සන සහිත ඔහුගේ/ඇයගේ විභාග ප්‍රවේශ පත්‍රය

විභාග මධ්‍යස්ථානයේ සිටින අධීක්ෂණ නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය. තම විභාග ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

8.3 අපේක්ෂකයකු ඔහුට/ඇයට වෙන්කළ විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුවේ. සෑම අපේක්ෂකයකුම ඔහු/ඇය විභාගයට පෙනී සිටීම සඳහා අදාළ ශාලාවට ඇතුළු වන පළමු දිනම ඔහුගේ/ඇයගේ විභාග ප්‍රවේශ පත්‍රය ශාලාධිපතිවරයා යටතට පත්කළ යුතුය. සියලු අපේක්ෂකයන් විසින් අනුගමනය කළ යුතු රීති මාලාවක් *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇත.

විභාගයට පෙනී සිටින පළමු දින අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ විභාග ශාලාධිපති වෙත ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීම පිළිබඳ වූ රීති මාලාවක් *ගැසට් පත්‍රයේ* ආරම්භයේ දක්වා ඇත.

9. *විභාගයට පෙනී සිටින මාධ්‍ය* : විභාගය සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.

9.1 අයදුම්කරුවෙකු ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට හැර අනෙකුත් ප්‍රශ්න පත්‍ර සියල්ලටම සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන් එක් මාධ්‍යයකින් පමණක් පිළිතුරු ලිවිය යුතුවේ.

10. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා දඬුවම් :

10.1 විභාගයට පෙනී සිටීමට පෙර, අතරවාරයේදී හෝ ඉන්පසුව අපේක්ෂකයෙකු නිසි සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය ප්‍රතික්ෂේප කළ හැකිවේ.

10.2 අයදුම්කරුවෙකු දැනුවත්වම අසත්‍ය තොරතුරු සපයා ඇති බව හෝ ඔහු/ඇය සිතාමතාම කිසියම් වැදගත් කරුණක් වසන් කරන ලද බව හෝ හෙළි වූ විට ඔහු/ඇය රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබීමට යටත් විය හැක.

11. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :

11.1 අපේක්ෂකයා ඔහු/ඇය පෙනී සිටීමට ඉල්ලුම් කරන සෑම විෂයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමට පත්වන පරිදි ඔහුගේ/ඇයගේ අනන්‍යතාව විභාග ශාලාවේදී ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් කවරක් හෝ ඉදිරිපත් කිරීම සෑහේ.

11.2 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

11.3 තැපැල්පති විසින් මෑත දී නිකුත් කරන ලද වලංගු හැඳුනුම්පතක්.

11.4 මෙම විභාගය පැවැත්වීමට වසර තුනකට වඩා අඩු කාලයක් තුළ නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

පාලිත ටී. බී. කොහොන.
ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය.

2007 මැයි මස 11 වැනි දින,
කොළඹ 01,
තැ.පෙ. අංක 583,
ජනරජ ගොඩනැගිල්ල,
විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

### ආකෘති අයදුම්පත්‍රය

### ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල රාජ්‍ය කළමනාකරණ සහකාර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීම සඳහා වන තරඟ විභාග අයදුම්පත

### APPLICATION FOR THE COMPETITIVE EXAMINATION FOR FILLING VACANCIES IN THE PUBLIC MANAGEMENT ASSISTANTS CADRE IN SRI LANKA MISSIONS ABROAD

‘අ’ කොටස

[ ]
කාර්යාල ප්‍රයෝජනය සඳහා

---

අයදුම්කරු පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යය (සිංහල - 2/දෙමළ - 3/ඉංග්‍රීසි -4)(අදාළ ඉංග්‍රීසි අක්ෂරය කොටුව තුළ ලියන්න). [ ]

1.0 නම :–

1.1 මුලකුරු සමඟ නම :————————.
මයා/මිය/මෙනවිය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා. Mr/Mrs/Miss. Silva M.A.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————————.

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :————————.

2.0 ස්ථිර ලිපිනය (ප්‍රවේශ පත්‍ර යැවිය යුතු, ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.1 ස්ථිර ලිපිනය : (සිංහලෙන්/දෙමළෙන්) :————————.

දුරකථන අංකය :————————.

2.2 රැකියා ස්ථානයේ ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————————.
දුරකථන අංකය :————————.

3.0 3.1 ස්ත්‍රී පුරුෂ භාවය : (ස්ත්‍රී 1 පුරුෂ 0) ☐
(අදාල අකුර සඳහන් කරන්න)

3.2 උපන් දිනය :
වර්ෂය :————————. මාසය :————————. දිනය :————————.

3.3 අයදුම්පත ඉදිරිපත් කළ යුතු අවසන් දිනට වයස :
අවුරුදු :————————.මාස :————————. දින :————————.

4.0 සේවය (රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය/පළාත් රාජ්‍ය කළමනාකරණ/පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය (අදාල නොවන වචන කපා හරින්න) :————————.

4.1 රාජ්‍ය සේවයට/පළාත් සේවයට/පළාත් පාලන සේවයට/පත්වීම් ලද මුල් දිනය සහ භාෂා මාධ්‍යය (අදාළ නොවන වචන කපා හරින්න) :—.

5.0 විවාහක/අවිවාහක බව : (විවාහක නම් M අකුර ද, අවිවාහක නම් S අකුරද යොදන්න.) ☐

5.1 විවාහක නම් දරුවන් සංඛ්‍යාව :————————.

ඔවුන්ගේ උපන් දින සහ වයස :————————.

6.0 කලත්‍රයා රැකියාවක යෙදේ නම් ඒ පිළිබඳ තොරතුරු (රාජ්‍ය නිලධාරියෙකු නම් සියලු විස්තර සඳහන කරන්න.) :————————.

7.0 අධ්‍යාපන සුදුසුකම් :
(භාෂා මාධ්‍යය ද සහිතව) :————————.

8.0 තනතුරේ උසස්වීම් ලද දින :

8.1 II පංතිය :————————.

8.2 I පංතියට :————————.

8.3 අයදුම්කරු වර්තමානයේ රැඳී සිටින පන්තිය සහ එයට පත් කළ දිනය :————————.

9.0 වර්තමාන වාර්ෂික වැටුප :————————.

10.0 පළපුරුද්ද :————————. (වසර ගණන සඳහන් කරන්න)

10.1 ගිණුම් :————————.
10.2 ආයතන කටයුතු :————————.

11.0 ප්‍රවීණතාවය :——————————.

| | කියවීම | ලිවීම | කථනය |
|---|---|---|---|
| (අ) සිංහල භාෂාව<br>(ආ) දෙමළ භාෂාව<br>(ඇ) ඉංග්‍රීසි භාෂාව<br>(ඈ) වෙනත් විදේශ භාෂා | | | |

12. කුසලතාව :

12.1 යතුරු ලියනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) :——————————.

12.2 පරිගනක භාවිතය (විස්තර සඳහන් කරන්න) :——————————.

13.0 අයදුම්කරු මීට පෙර ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයක සේවය කර ඇත්නම්, එම දූත මණ්ඩලයේ නම හා සේවය කළ දිනය :——————.

14.0 වෙනත් සුදුසුකම් :——————————.

*සටහන* - විභාග ගාස්තු ගෙවීමේදී තැපැල් කාර්යාලයෙන් නිකුත් කරන ලද ලදුපත

1. ලදුපත් අංකය :——————————.
2. තැපැල් කාර්යාලය :——————————.
3. දිනය :——————————.
4. මුදල :——————————.

15. *අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සහතිකය* :-

2007.06.25 දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලසීමාව තුළ ලැබිය යුතු සියලුම වැටුප් වර්ධක මවිසින් උපයාගෙන ඇති බවත් අවවාද කිරීම හැර කිසිදු විනය දඬුවමකට භාජනය නොවූ බවත් මෙයින් ප්‍රකාශ කරමි. තවද, මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බවත් ප්‍රකාශ කරමි.

——————————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :——————————.

'ආ' කොටස

(දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කිරීම සඳහා)

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ/පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ/පළාත් පාලන කළමනාකරණ සහකාර සේවයේ I පංතියේ / II පංතියේ නිලධාරියෙකු/නිලධාරිනියක වන ——————————.මහතා/මිය/මෙනවිය

(අ) ——————————. දිනට පූර්වාසන්න පස් අවුරුදු කාල සීමාව තුළදී සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්,

(ආ) 2007.06.25 දිනට පූර්වාසන්න පස් අවුරුදු කාල සීමාව තුළ දී කිසිදු විනය දඬුවමකට භාජනය වී නැති බව හා අයදුම්පත්‍රයේ සඳහන් කළ කරුණු සත්‍ය බවත්,

මවිසින් පරීක්ෂාකර බලන ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

*නිර්දේශය* :-

(1) විදේශ දූත මණ්ඩල සේවය සඳහා අයදුම්කරු/අයදුම්කාරිය යෝග්‍ය බව,

(2) තෝරාගත හොත් අයදුම්කරු/අයදුම්කාරිය වහාම මුදාහළ හැකි/නොහැකි බව.

——————————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
නිලමුද්‍රාව.

පදවි නාමය :——————————.
දිනය :——————————.

05-446/2

## වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ජාතික වෘත්තීය පුහුණු ආයතනය - රත්මලාන**

*2007 II වන අර්ධ වර්ෂය සඳහා ආධුනික ආධුනිකාවන් බඳවා ගැනීම*

පහත දැක්වෙන පාඨමාලා සඳහා ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | *පාඨමාලාව* | *පාඨමාලා කාලය (පූර්ණ කාලීන) සහ අධ්‍යාපන සුදුසුකම්* | *පාඨමාලා ගාස්තුව* |
|---|---|---|---|
| 1. | උපකරණ තාක්ෂණ ශිල්පී (Instrument Technician -Electronic, Electrical, Pneumatics and Hydraulic Industrial Process Control) | මාස 18 (අ.පො.ස. (සා.පෙළ) ගණිතය, විද්‍යාව සම්මාන සහිතව සහ (උ.පෙ.) ගණිත විද්‍යා අංශයෙන් පෙනී සිටී.) | රු.12,000 00 |
| 2. | වඩු කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) (Carpenter - Furniture) | මාස 12 (09 වසර සමත්) | නොමිලේ |
| 3. | පෙදරේරු ශිල්පී (mason) | මාස 06 (09 වසර සමත්) | නොමිලේ |
| 4. | ජලනල කාර්මික ශිල්පී (Plumbing) | මාස 06 (09 වසර සමත්) | නොමිලේ |
| 5. | මෝටර් රථ වැද්දුම් ශිල්පී (Automobile Tinker) | මාස 06 (09 වසර සමත්) | නොමිලේ |
| 6. | ඇළුමිනියම් පිරිසැකසුම් කාර්මික ශිල්පී (Aluminium Fabricator) | මාස 06 (09 වසර සමත්) | රු. 1,500 00 |
| 7. | පරිගණක යෙදුම් සහයක (Computer Application Assistant) | මාස 06 (අ.පො.ස) (සා.පෙ) ගණිතය, ඉංග්‍රීසි සඳහා සම්මාන සහිතව සමත්වීම. | රු. 3,000 00 |
| 8. | පරිගණක (දෘඩාංග) ශිල්පී (Computer Hardware Technician) | මාස 06 (අ.පො.ස. (සා.පෙ.) ගණිතය, ඉංග්‍රීසි සඳහා සම්මාන සහිතව සමත්වීම.) | රු. 9,000 00 |

ඉහත පාඨමාලා හදාරන ඔබට/ඔබේ දරුවාට පුහුණු කාලය තුළ ලැබෙන පහසුකම්

* දුෂ්කර දුර බැහැර පෙදෙස්වල ආධුනිකයන් සඳහා නේවාසික පහසුකම්.
* අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන් සඳහා ශිෂ්‍යත්ව
* රැකියා ලොව ඉහළ පිළිගැනීමකට ලක්වූ වෘත්තීය නිපුණතා මට්ටමේ සහතික (රජයේ පිළිගත් වෘත්තීය පුහුණු සහතිකයක්)
* තෝරාගත් පුහුණු පාඨමාලා සඳහා මාසික දීමනාවක්
* වෘත්තීය මාර්ගෝපදේශනය සහ ව්‍යවසායකත්ව දැනුම
* ස්වයං රැකියා ආරම්භ කරන්නන් සඳහා ණය පහසුකම්
* ලංගම මගී වාර ප්‍රවේශ පත්‍ර

විශේෂයි -

* කාන්තා අයදුම්කාරියන් සඳහා ප්‍රමුඛත්වය
* දුර බැහැර පෙදෙස්වල අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය
* වයස අවුරුදු 18-30 අතරවීම.

*පාඨමාලා සඳහා අයදුම්කිරීම.*–

ඔබේ පෞද්ගලික තොරතුරු, දක්ෂතා, රුචිකත්වයන් ඇතුළත් කර ඔබ විසින්ම සකස් කරන ලද අයදුම්පතක් පහත ලිපිනයට 2007.06.15 දිනට පෙර යොමුකරන්න.

සහකාර අධ්‍යක්ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
අංක 100, කඳවල පාර,
රත්මලාන.
දුරකථන අංක : 011-2368850

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
නාරාහේන්පිට.

05-399

---

## රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2006

1.0 රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගයක්, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2007 සැප්තැම්බර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 මධ්‍යම රාජ්‍ය සේවයට අයත් කණිෂ්ඨ සේවකයින් සඳහා මෙම විභාගය පහත සඳහන් නගරවල දී පැවැත්වේ. එම නගර සහ නගරවලට අදාල නගර අංක පහතින් දැක්වේ. ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයින්ගේ දෙවන මනාපය පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ.

| *නගරය* | *නගර අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| කොළඹ | 01 | ත්‍රිකුණාමලය | 14 |
| ගම්පහ | 02 | මඩකලපුව | 15 |
| කළුතර | 03 | අම්පාර | 16 |
| මාතලේ | 04 | පුත්තලම | 17 |
| මහනුවර | 05 | කුරුණෑගල | 18 |
| නුවරඑළිය | 06 | අනුරාධපුරය | 19 |
| ගාල්ල | 07 | පොළොන්නරුව | 20 |
| මාතර | 08 | බදුල්ල | 21 |
| හම්බන්තොට | 09 | මොණරාගල | 22 |
| යාපනය | 10 | කෑගල්ල | 23 |
| මන්නාරම | 11 | රත්නපුර | 24 |
| මුලතිව් | 12 | කිලිනොච්චිය | 25 |
| වව්නියාව | 13 | | |

3.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0 අයදුම්කරුවන් මෙම විභාගයට පෙනී සිටිය යුතු භාෂා මාධ්‍ය :- අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකිය.

5.0 *වැටුප.*–අංක 06/2006 හා 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III , II හා I වන පන්තිවලට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 13,640- 10 x120 - 11x 140 - 6 x 210, 14 x 290 - 21,700 වේ. රු. 14,840 න් ඔබ්බට යාම සඳහා, II වන පන්තියට උසස්වීම ද රු. 16,380 න් ඔබ්බට යාම සඳහා, I වන පන්තියට උසස් වීම ද ලබාගත යුතුය.

*සටහන* :- පත්වීම ලබන අවධියේ ක්‍රියාවේ යෙදෙන වැටුප් වැඩිවීමේ නීතිරීතිවලට යටත්ව, ඔවුන්ට වැටුප් වැඩිවීම් වාසි ලබාදෙනු ලැබේ.

6.0 සේවා කොන්දේසි :

(i) මෙම විභාගයෙන් සාමාර්ථය ලබන අයදුම්කරුවන්ට පත්වීමේ දින සිට එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්වීම් දෙනු ලැබේ. ඔවුන්ගේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ පසු සේවයෙහි ස්ථිර කිරීම සිදු කරනු ලැබේ.

(ii) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත් කරන ලද අයදුම්කරුවන් ස්ථාන මාරු කිරීමටත්, ලංකාවේ ඕනෑම තැනකට පත් කිරීමටත් යටත්වේ.

7.0 පත්වීම සඳහා තෝරාගනු ලබන අන්දම :- මධ්‍යම රජයේ පුරප්පාඩු සඳහා මධ්‍යම රාජ්‍ය සේවයේ යෙදෙන කණිෂ්ඨ සේවක සේවිකාවන් පමණක් තරග විභාගයට ඇතුළත් කර ගන්නා අතර තෝරා ගැනීම තරග විභාගයේ දී ලබා ගන්නා ලකුණු මත පදනම් වනු ඇත.

*8.0* යෝග්‍යතාව :- මෙම විභාගය සඳහා තරග කිරීමට සුදුසුකම් ලැබීම පිණිස සෑම අපේක්ෂක අපේක්ෂිකාවක්ම

(i) 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව පීඑල්-1-2006, පීඑල්-2-2006 සහ පීඑල්-3-2006 වැටුප් කේත අංක යටතේ වන වැටුප් පරිමාණයක් සහිත ස්ථිර පත්වීම් දරන මධ්‍යම රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයෙකු විය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය. (ආයතන සංග්‍රහයේ I වැනි පරිච්ඡේදයේ දැක්වෙන අර්ථ නිරූපනයකට ඇතුළත් රජයේ සේවකයෙකු/සේවිකාවක විය යුතුය.)

(ii) 2006.12.31 දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සක්‍රිය සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

(iii) අපේක්ෂකයන් භාෂාව/සාහිත්‍යය හා අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් හයක් (06) ඇතිව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයෙන් සමත්ව සිටිය යුතුය.

*සටහන* :-

1. යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තාවූ හෝ පුහුණු වීමේ කාල පරිච්ඡේදයක් ඉහත (ii) හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත II හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

2. රජයේ සේවයේ සියලුම මෝටර් රථ රියදුරන්ට, සෙසු සුදුසුකම් තිබේ නම් තම වැටුප් ක්‍රමය කවරක් වුව ද ඒ ගැන නොතකා මෙම තරග විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ.

3. ඉහත II හි සඳහන් අවුරුදු 05ක සතුටුදායක සේවය පහත සඳහන් පදනම මත තීරණය කරනු ලැබේ. පහත සඳහන් අවශ්‍යතාවන් සම්පූර්ණ කර ඇති අය මෙම විභාගයේ කාර්යයන් සඳහා සතුටුදායක සේවයක් ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් සේ සළකනු ලැබේ.

(*අ*) 2006.12.31 වැනි දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ දී ලැබෙන සියලුම වැටුප් වර්ධක ලබා තිබීම.

(*ආ*) 2006.12.31 වැනි දිනට පෙර වර්ෂ 05ක් තුළ දී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් කර නොතිබීම.

4. පත්වීම සඳහා අයදුම්කරු/අයදුම්කාරිය තෝරාගනු ලැබී නම් ඔහු/ඇය මුදා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා කැමති විය යුතුය.

5. අර්ධ කාර්මික කාර්යයන්හි නියුක්තව සිටින්නාවූ හෝ යම් කාර්යයක් සඳහා පුහුණු කර ඇත්තා වූ හෝ රජය විසින් විශේෂ පුහුණුවක් ලබාදී ඇත්තා වූ කවර හෝ ශ්‍රේණියක සේවකයින් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් නොවනු ඇත. නිදර්ශන වශයෙන් ඉංජිනේරු හා කර්මාන්තශාලා ශ්‍රේණිවල සේවකයින් හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය සේවිකාවන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු නොවනු ඇත. යම් සේවකයකු සුදුසු ද නුසුදුසු ද යන කරුණු පිළිබඳව යම් සැකයක් පහළ වූ විට දී ඒ සම්බන්ධයෙන් අයදුම්කරු/අයදුම්කාරිය, ඔහුගේ/ඇයගේ දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතු අතර එම දෙපාර්තමේන්තුව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ඒ සම්බන්ධව විමසිය යුතුය.

මෙම විභාගයට පෙනී සිටීම සඳහා යම් සේවකයෙකුගේ යෝග්‍යතාව සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් විමසීමේදී වැටුප් පරිමාණය සහිතව සේවකයාගේ කාර්යයන් පිළිබඳව පූර්ව විස්තරයක් අදාළ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ යුතු අතර, එම කාර්යය දැරීම සඳහා අවශ්‍යතාව සපුරා ගැනීමට පුහුණුවක් අයදුම්කරුට/අයදුම්කාරියට ලබාදී ඇත්ද යන වග හා එවැනි පුහුණුවක් වෙතොත් එම පුහුණුවේ ස්වභාවය හා කාල සීමාව ද සඳහන් කළ යුතුය.

6. රාජ්‍ය සේවයේ තාවකාලික හා අනියම් සේවකයින්, මණ්ඩල සංස්ථා හා එවැනි අංශවල සේවකයින් මෙම විභාගයේදී තරග කිරීමට සුදුස්සන් නොවනු ඇත.

7. මෙහි නියමිත සුදුසුකම් තමන් විසින් සපුරා ඇති බවට අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අයදුම්කරුවන්/අයදුම්කාරියන් සෑහීමකට පත්විය යුතුය. මෙම නිවේදනයේ දැක්වෙන සුදුසුකම් නොමැතිව විභාගයට ඉදිරිපත් වන අයදුම්කරුවන් /අයදුම්කාරියන් විභාගයේදී ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුව ද පත්වීම් ලැබීමට නුසුදුස්සෝ වෙති.

8. තැපැල් දෙපාර්තමේන්තුවට අයත් ඒකාබද්ධ සේවයේ කණිෂ්ඨ සේවකයින්ට හැර එම දෙපාර්තමේන්තුවේ වෙනත් කිසිම කණිෂ්ඨ සේවකයකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නැත.

9. *අයදුම්පත්* :-

(i) මෙම විභාගයට ඇතුළත් වීමේ ආදර්ශ අයදුම්පතක් මේ නිවේදනයට යාකර ඇත. අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් සම්පූර්ණ කර ඒ4 ප්‍රමාණයේ කඩදාසි ප්‍රයෝජනයට ගනිමින් පළමු පිටුවට අංක 1.0 සිට 3.0 දක්වා ඇතුළත් වනසේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකසා ගත යුතුය.

(ii) *විභාග ගාස්තු* - විභාග ගාස්තුව රු. 250කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ 4000-20-03-20-13 ආදායම් ශීර්ෂය යටතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

(iii) අයදුම්පත නිවැරදිව ද පැහැදිලි ව ද අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්අකුරින්ම සම්පූර්ණ කොට 2007.06.26 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මාර්ගයෙන් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය.

(iv) අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කරගත යුතු වන අතර, එක් අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් බව ද අයදුම්පතේ ඡායා පිටපත් හෝ ප්‍රගමන පිටපත් නොඑවන මෙන් ද දන්වා සිටිනු ලැබේ.

10. අයදුම්පතේ අගට යොදා ඇති අත්දමේ සහතිකයක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් දිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිළිව ලිවිය යුතුය. යම් අයදුම්කරුවෙකු/ අයදුම්කාරියක මෙම ක්‍රියාපිළිවෙත අනුගමනය කිරීමට අපොහොසත් වුවහොත් ඔහුගේ/ඇයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. 2007.06.26 වැනි දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීම සඳහා ස්වකීය අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත කල් ඇතුව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්/අයදුම්කාරියන් වෙත දන්වා සිටිනු ලැබේ.

11. අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමඟ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. ඒ හා සමගම ඒ බැව් සඳහන් පුවත්පත් නිවේදනයක් “දිනමිණ”, “තිනකරන්”, හා “ඩේලිනිවුස්” යන පුවත්පත්වල පළවනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත් ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. යම්කිසි නිලධාරියෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින 07කටවත් පෙර විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු බව පහත සඳහන් විස්තර සමඟ විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල (විදුලි පණිවුඩ ලිපිනය, “විභාග” බත්තරමුල්ල) වෙත දැන්විය යුතුය.

(i) විභාගයේ නම :——————.
(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————.
(iii) සම්පූර්ණ ලිපිනය :——————.
(iv) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය හා යැවූ දිනය :——————.
(v) විභාග ගාස්තු ගෙවූ ලදුපතේ ඡායා පිටපත :——————.
(vi) ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපත :——————.

12. විභාගයට ඇතුලත් කර ගැනීම, ඊට යෝග්‍යතාව පිළිගැනීමක් නොවේ. එසේ ඇතුළත් කර ගැනීම පසු අවස්ථාවකදී පිරික්සා බැලීමට යටත් වන්නකි. විභාගයේ දී තරග කිරීමට නුසුදුස්සෙකු බව පසු අවස්ථාවකදී අනාවරණය වූ අයදුම්කරුවෙකුගේ/අයදුම්කාරියකගේ අපේක්ෂකත්වය විභාගයට පෙර, විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයට පසු කවර අවස්ථාවකදී වුවද අවලංගු කරනු ලැබිය හැකිය.

13. විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරනු ඇත.

14. අයදුම්කරුවන්ගේ අනන්‍යතාව - අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

15. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

16. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්* - ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

17. *විභාග පරිපාටිය* :- විභාග විෂය හා ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දැක්වේ.

| | *විෂය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| (i) | සාමාන්‍ය දැනීම | 100 | පැය 2 |
| (ii) | අභියෝග්‍යතා පරීක්ෂණය | 100 | පැය 1 |
| | එකතුව | 200 | |

*සටහන* - (i) සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයකුගේ යෝග්‍යතාව හා හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත.

(ii) සෑම ලිඛිත උත්තර පත්‍රයක ම නොපැහැදිලි අත් අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් ලකුණු අඩු කරනු ඇත.

(iii) ඉහත එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු සියයට 40ක් (40%) වත් ලබාගත යුතුවේ. කුසලතා අනුපිළිවෙල හා පවත්නා පුරප්පාඩු ප්‍රමාණය අනුව ම පත් කිරීම් කරනු ලැබේ.

(iv) මෙම විභාගයේ විෂයයන් අදාළ ප්‍රශ්න පත්‍ර වල ව්‍යුහය යථා කාලයේ දී රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ වෙබ් අඩවි යෙහි පළ කරනු ඇත. (අන්තර් ජාල ලිපිනය) www.pubad.gov.lk

18. මෙම විභාග නිවේදනයට විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

ඒ. නෝබට්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2007 මැයි මස 07 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණයි)

රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට උසස් කිරීමේ
සීමිත තරග විභාගය - 2006

LIMITED COMPETITIVE EXAMINATION FOR PROMOTION OF MINOR EMPLOYEES OF THE PUBLIC SERVICE TO CLASS III OF THE PUBLIC MANAGEMENT ASSISTANTS' SERVICE - 2006

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |

(*ගැසට් නිවේදනය* අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය සඳහන් කරන්න.)

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :-
සිංහල - 2/දෙමළ -3/ඉංග්‍රීසි -4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා :Silva, A.B.

1.2 සම්පූර්න නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 සේවා ස්ථානය හා ලිපිනය :————.

2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂභාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය: වර්ෂය : මාසය: දිනය :

3.3 ජාතික හැඳුනුම්පත් අංකය :

4.0 සේවා විස්තරය:

4.1 ඔබ දැනට සේවය කරන දෙපාර්තමේන්තුවේ නම :————————.

4.2 දැනට දරන තනතුරේ පදවි නාමය :————————.

4.3 දැනට දරන තනතුරට පත්වූ දිනය :————————.

4.4 දැනට දරන තනතුර ස්ථිර ද නැතහොත් තාවකාලික ද යන වග :————————.

4.5 දැනට දරන තනතුරෙහි සේවය ස්ථිර කර තිබේද යන වග :————————.

4.6 සේවය ස්ථිර කර තිබේ නම් ස්ථිර කිරීම සඳහා යෝග්‍යතා ලැබූ දිනය :————————.

4.7 දැනට දරන තනතුරේ සේවය ස්ථිර කරමින් නිකුත් කරන ලද ලිපියේ යොමු අංකය හා දිනය :————————.

4.8 දැනට ලබන වාර්ෂික වැටුප (ඒකාබද්ධ) :————————.

4.9 දැනට දරන පත්වීම විශ්‍රාම වැටුප් සහිත ද යන වග :————————.

5.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

i. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————————.
ii. ලදුපත් අංකය හා දිනය :————————.
iii. ගෙවූ මුදල :————————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සෙකු කිරීමටත්, පත් කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමටත් හැකි බව මම දනිමි.

————————.
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන
(දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරිපිට දී)

දිනය :————————.

සටහන: තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන මහතා/මහත්මිය/මෙනෙවිය ............. වැනි දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව සහතික කරමි.

————————.
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————————.
පදවි නාමය :————————.
ලිපිනය :————————.
දිනය :————————.

### දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

1. මෙම අයදුම්කරු/අයදුම්කාරිය වන ........................................ මහතා/මහත්මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අයකු බවද,
2. ඔහු/ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බව ද,
3. ඔහු/ඇය ස්ථිර තනතුරක 2006.12.31 දින වන විට සේවයේ ස්ථිර කරනු ලැබ සිටින බව ද,
4. ස්ථිර තනතුරක සේවයේ ස්ථිර කරමින් ලිපියක් ඔහුට/ඇයට නිකුත් කර ඇති බව ද,
5. ඔහු/ඇය 2006.12.31 වැනි දිනට හෝ ඊට පෙර යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කර ඇති බවද,
6. ඔහු/ඇය මෙම *ගැසට් නිවේදනයේ* 8.0 ඡේදයේ නියමිත සීමාවන් ඇතුළත ඇති වැටුප් ලබමින් හෝ වැටුප් ක්‍රමයක සිටින බවද,
7. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම 2006.12.31 වැනි දිනට පූර්වාසන්න අවුරුදු 05 ඇතුළත සතුටුදායකව පැවැති බවද,
8. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බවද,
9. රුපියල් 250ක් වටිනා ලදුපතක් අයදුම්පත්‍රයේ අලවා ඇති බවද,
10. ඔහුගේ/ඇයගේ අයදුම්පතෙහි දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛණ සමඟ හරිවැරදි බලා ඇති බව සහ මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බවද, මම සහතික කරමි.

——————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව

නම :——————.
පදවි නාමය :——————.
ලිපිනය :——————.
දිනය :——————.

*සංලක්ෂ්‍ය* -

(1) දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට නිසි ආකාර බලතල පවරනු ලැබූ මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් පමණක් මෙම සහතිකය අත්සන් කළ යුතුය. සහතිකයේ අඩංගු කරුණු සෑම අයුරකින්ම නිවැරදි බවට සහතිකය නිකුත් කරන නිලධාරියා සෑහීමකට පත්විය යුතුය.

(2) යෝග්‍යතාව පිළිබඳව සියලුම අවශ්‍යතාවන් සම්පූර්ණ නොකරන අයදුම්කරුවන් වෙතොත් ඔවුන්ගේ අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් නොකළ යුතුය.

05-431

---

## ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය

### II වන පන්තියේ II වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය - 2007

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියේ සිවිල්/යාන්ත්‍රික/විදුලි/රසායනික ඉංජිනේරු තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙයට යාකර ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ/4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කරන ලද අයදුම්පත් 2007.06.25 දින හෝ ඊට පෙර ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ඉසුරුපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වමත් ඉහළ කෙළවරෙහි "ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියේ තනතුරු සඳහා වන විභාගය - 2007" යනුවෙන් පැහැදිලිව දැක්විය යුතුය.

*සැ. යු.* - (i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන* : ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලිපියක් හෝ තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කරන පැමිණිලි සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි ඉල්ලුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(ii) රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 ට අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට එස්එල්/1/2006 වැටුප් බණ්ඩය හිමිවන අතර, ඊට අදාළ වැටුප් පරිමානය (මාසික) 22,935-10 x 645-8 x 790-17 x 1,050-53,555 වේ. ඒ අනුව ඉහත වැටුප් පරිමානයේ ආරම්භක වැටුප් පියවර වන රු. 22,935 (මාසික) ඔබට හිමිවනු ඇත. එම වැටුප් පරිමානයේ 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම ද හත්වන වැටුප් පියවරට එළඹීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම ද ඇත. (පූර්ණ වෘත්තීය සුදුසුකම්)

04. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ අතිකුත් විශේෂ සේවා කොන්දේසි පහත දැක්වේ.

(i) පූර්ණ වෘත්තීය සුදුසුකම් සහිත අපේක්ෂකයෙකු පත්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි රු. 26,160(මාසික) වැටුප් පියවර මත පිහිටුවනු ලැබේ.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයකු I වන කාර්යක්ෂමතා කඩඉම පසුකර යාමට නම් නියමිත පරීක්ෂණයකින් සමත්විය යුතුය. මෙම පරීක්ෂණයේ විෂය නිර්දේශය සහ පරීක්ෂණ පරිපාටිය ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව අනුව වේ. පූර්ණ වෘත්තීය සුදුසුකම් සහිතව පත් කරනු ලබන අපේක්ෂකයෙකු එලෙස I වැනි කාර්යක්ෂමතා කඩඉම පසුකර යාම සඳහා ඇති පරීක්ෂණය තමා පත් කරනු ලැබූ දින සිට අවුරුදු 2 ක් ඇතුළත සමත් විය යුතුය.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයකු II වන කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කරනු ලැබීම සඳහා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ නියම කර ඇති පරිදි පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබාගත යුතුය.

05. උසස්වීම් ඉඩ ප්‍රස්ථා - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියේ සිට II වන පන්තියේ I වන ශ්‍රේණියට හා I වන පන්තියට උසස් වීමේ ඉඩ ප්‍රස්ථා ඇත.

06. සේවයේ යෙදවීම පිළිබඳ පොදු නියමයන් හා කොන්දේසි -

i. මෙම තනතුර ස්ථිරය, දායක විශ්‍රාම වැටුප් අරමුදල යටතේ දායක විශ්‍රාම වැටුපකට හිමිකම් ඇත. පත්වීම අවුරුදු 3ක පරිවාස කාලයකට යටත්වේ.

ii. තෝරාගනු ලබන අපේක්ෂකයන් දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය.

iii. තෝරාගනු ලබන අපේක්ෂකයින් ඒ ඒ අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල හා පළාත් සභා වල ඇති ඉංජිනේරු ශික්ෂණයන්හි පවත්නා පුරප්පාඩු අනුව ඒ ඒ දෙපාර්තමේන්තුවල හා පළාත් සභා වල ඇති පුරප්පාඩු තනතුරු වලට පත් කරනු ලැබේ.

iv. රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද 1988 ජූනි මස 07 වන දින හා අංක 509/7 දරන ශ්‍රී ලංකා ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* හා 1989.12.29 දිනැති අංක 590/12 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* හා 2004.07.22 දිනැති අංක 1350/24 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කොන්දේසි වලටද, ඒ සඳහා මින් මතු කෙරෙන්නාවූ සංශෝධනයන්ගෙන් ද මෙම පත්වීම පාලනය වනු ඇත.

07. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* - සෑම අයදුම්කරුවෙකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

i. තමා විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

ii. ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි බව ( දැනටමත් රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

iii. (අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයකින් ලබාගත් අදාළ ඉංජිනේරු ශික්ෂණයන්ට අයත් ඉංජිනේරු උපාධියක් හෝ වෙනත් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ආයතනයකින් හෝ ලබාගත් එයට සමාන ඉංජිනේරු උපාධියක් තිබීම

හෝ

(ආ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සඳහා අයදුම්කරුට සුදුසුකම් ලබා දෙන්නා වූ නියමිත ඉංජිනේරු ශික්ෂණයන්ට අදාල අවශ්‍ය පරීක්ෂණවලින් සමත්වී තිබීම.

හෝ

(ඇ) අනුග්‍රාහක ආශ්‍රිත සාමාජිකත්වය සඳහා ඉල්ලුම්කරුවන්ට සුදුසුකම් ලබා දෙන්නා වූ නියමිත ඉංජිනේරු ශික්ෂණයන්ට අදාල එක්සත් රාජධානියේ ඉංජිනේරු ආයතන සභාව මගින් හෝ එහි අනුප්‍රාප්තික ආයතනයකින් හෝ පවත්වනු ලබන පරීක්ෂණයකදී සියලුම කොටස් වලින් පූර්ණ සාමාර්ථය ලබා තිබීම.

හෝ

(ඈ) පිළිගත් ඉංජිනේරු ආයතනයක නියමිත ඉංජිනේරු ශික්ෂණයන්ට අදාළ වරලත් සාමාජිකත්වයක් හෝ අධි සාමාජිකත්වයක් හෝ ලබා තිබීම.

iv. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දින වන විට ප්‍රතිඵල බලාපොරොත්තුව සිටින අපේක්ෂකයින්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. පහත සඳහන් ලියකියවිලිවලින් එකක් හෝ සියල්ලම හෝ අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින්ට නියම කරනු ඇත. එම ලියකියවිලි අයදුම්පත සමග අමුණා එවීම අවශ්‍ය නැත.

(අ) උප්පැන්න සහතිකය
*සැ.යු.* : බෞතිස්ම සහතිකය හෝ උපකෘති පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවල කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය පිළිගනු නොලැබේ.

(ආ) උපාධි සහතිකය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්
මෙයින් එකක් අධ්‍යයන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගේ හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඉ) සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් සමත්වී ඇති උසස්ම විභාග පිළිබඳ සහතික.

09. i. ඉල්ලුම්පත අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන්ම විය යුතුය.

ii. ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්පතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

iii. අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ විගස ම පුවත්පත් වල දැන්වීමක් පළකරනු ලැබේ. නියමිත දිනට දින 07කට කලින් ප්‍රවේශ පත්‍ර නොලබන අපේක්ෂකයෙකු පහත සඳහන් විස්තර ඇතිව වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් ජනරාල්, ඉසුරුපාය, බත්තරමුල්ල වෙත අප්‍රමාදව දැන්විය යුතුය. (විදුලි පණිවුඩ සඳහා ලිපිනය, විභාග, කොළඹ)

(අ) විභාගයේ නම
(ආ) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම
(ඇ) ලිපිනය
(ඈ) ඉල්ලුම්පත තැපැල් කළ දිනය, ලියාපදිංචි අංකය සහ දිනය

10.*විභාග ගාස්තු* - විභාග ගාස්තුව රු. 300කි. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම ඕනෑම දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකට විභාග ගාස්තු ආදායම් ශීර්ෂ 4000-20-03-20-13ට බැර කිරීම සඳහා ගෙවිය යුතුය. දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් හෝ ලබාගත් ලදු පත ඉල්ලුම්පත්‍රයෙහි අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. නියමිත විභාග ගාස්තුව ඉහත සඳහන් පරිදි නොගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

11. විභාග දිනය. මෙම විභාගය 2007 සැප්තැම්බර් මස හෝ ඊට පෙර කොළඹ දී පමණක් පැවැත්වීමට අපේක්ෂිතය.

12. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ. (අංක 09 දරන කොන්දේසි හැර)

13. විභාගයට ඇතුළත් වීම :

(අ) ඉල්ලුම්පත් ලැබී ඇති සියලුම අපේක්ෂකයන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ පරිපාලකට තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාගයට අදාළ ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම විභාගයට පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාරදිය යුතුය. අපේක්ෂකයින් විසින් අනුගමනය කළ යුතු නීතිරීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ පළ කර ඇත.

*සටහන.*–අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් කිරීමට සුදුසුකම් සපුරා ඇති බවට සාක්ෂියක් ලෙස නොසැලකිය යුතුය.

14. *අපේක්ෂකයාගේ අනන්‍යතාව.*–තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින්, සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

(අ) වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රය)
(ආ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත.

15. සාවද්‍ය තොරතුරු සැපයීම - අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් ම යටපත් කර ඇත්නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

16. *විභාග ක්‍රමය - විභාග මාධ්‍ය -*

(අ) විභාගය සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් විභාගයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින්ය.

අපේක්ෂකයෙකු සුදුසුකම් ලත් විභාගයේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත්වී ඇත්නම් එම විභාගයේ දී ඔහු සමත්වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට යොදාගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය යුතුය.

(ඇ) ප්‍රධාන විෂයය එක භාෂාවකිනුත්, අතිරේක විෂයය තවත් භාෂාවකිනුත් සමත්වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයෙකු ප්‍රධාන විෂයයන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය යුතුය.

*සටහන* - I. ඉහත (අ) සහ (ඇ) හි "සුදුසුකම්ලත් විභාගය" යන පදයෙන් අදහස් කරන්නේ (07)III ඡේදයේ ඇති විභාගය වේ.

II. අපේක්ෂකයා විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය.

III. තම ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් විභාග භාෂාව හෝ විෂයයන් හෝ ඒවායේ මට්ටම් හෝ වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

17. *බඳවා ගැනීමේ ක්‍රමය.*–පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයක් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ. අපේක්ෂකයින් ප්‍රශ්න පත්‍ර දෙකටම (02) පෙනී සිටිය යුතුය.

(අ) බුද්ධි පරීක්ෂණය - ලකුණු 100 - පැය 1 ක ප්‍රශ්න පත්‍රයකි.
(ආ) සාමාන්‍ය දැනීම - ලකුණු 100 - පැය 1 ක ප්‍රශ්න පත්‍රයකි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දෙනු නොලැබේ.

18. *පත්කිරීම පිණිස තෝරා ගැනීමේ ක්‍රමය.*–ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයට ලකුණු 40 ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් මුළු ලකුණු ප්‍රමාණය අනුව ඉහළම ලකුණු ලබන අපේක්ෂකයින් ඉහත සඳහන් විධිවිධාන යටතේ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

අපේක්ෂකයින් කිහිප දෙනෙකු එකම ලකුණු ලබා ඇත්නම් එවැනි අවස්ථාවල සුදුසු තීරණයක් ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන අතර, එය අවසාන තීරණය වනු ඇත.

19. විෂය නිර්දේශය -

(අ) බුද්ධි පරීක්ෂණය - පැය 1
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයත්, ඔහුගේ සිතෙහි විශ්ලේෂණ තත්ත්වයත්, ඔහු තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහාය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්නවලින් යුක්ත වනු ඇත.

(ආ) සාමාන්‍ය දැනීම - පැය 01
අපේක්ෂකයා වාසය කරන හා සේවය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද, ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය ද සම්බන්ධයෙන් ඇති ඔහුගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත පොදු ප්‍රශ්න පත්‍රයකි.

20. පත්කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම නොපිරවීමට ද, මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණය ගැනීමට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,
ඉංජි. කේ. එම්. පී. එස්. බණ්ඩාර,
ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ.

2007 මැයි මස 09 වැනි දින,
ඉංජිනේරු සේවා අංශය,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

## ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ ඉංජිනේරු තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2007**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ☐ සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි -4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : ——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SILVA, A.B.

1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම : ——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම : ——————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 ස්ථිර ලිපිනය : ——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.1 ස්ථිර ලිපිනය : ——————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 රාජකාරි ලිපිනය : ——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : ——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 ඉල්ලුම් කරන තනතුර

| | |
|---|---|
| 1. සිවිල් | |
| 2. යාන්ත්‍රික | |
| 3. විදුලි ඉංජිනේරු | |
| 4. රසායනික | |

(අදාළ කොටුව තුළ X ලකුණ යොදන්න)

4.0

4.1 ජනවර්ගය ☐
(1. සිංහල, 2. දෙමළ, 3. ඉ. දෙමළ, 4. මුස්ලිම් 5. වෙනත්)

4.2 ස්ත්‍රී 1 පුරුෂ 0 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.3 විවාහක/අවිවාහක බව: විවාහක 2 අවිවාහක 1 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

4.5 උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

4.6 ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

5.0 5.1 අධ්‍යාපන සුදුසුකම් :
(දිනය, පන්තියක් වේ නම් එම පන්තිය, විෂයයන් හා ආයතනයන් හි නම් ද ඇතුළත්ව සියලු උපාධි, වෘත්තීය හා කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර කරුණාකර සඳහන් කරන්න.)

| විභාගය/උපාධි | පන්තිය | අවුරුද්ද | විෂයයන් | ආයතන |
|---|---|---|---|---|
| | | | | |

5.2 වෘත්තීය සුදුසුකම් :

6.0 දැනට නියුතු රැකියාව සහ පෙර රැකියාවක් කරන ලද්දේ නම් ඒ පිළිබඳ විස්තර :
(රැකියාවට බැඳුනු දිනය හා ඉවත් වූ දිනයන් ද, එසේ ඉවත්වීමට හේතූන් ද සඳහන් කළ යුතුය.)

6.1 තනතුර : ——————.
6.2 දෙපාර්තමේන්තුව/ආයතනය : ——————.
6.3 පත්වීම් දිනය : ——————.
6.4 ස්ථිර/විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත/තාවකාලික ද යන වග : ——————.
6.5 තනතුර ස්ථිර කර තිබේ ද යන වග : ——————.
6.6 තනතුරේ වැටුප් පරිමාණය සහ දැනට ලබන වැටුප : ——————.

7.0 යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියක දී වරදකරු වී ඇත්නම්, එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න. : ——.

8.0 මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ මනා ලෙස අලවන්න.
(කුවිතාන්සියේ ඡායා පිටපතක් තමන් වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

කුවිතාන්සි අංකය : ——————.
ගෙවන ලද කාර්යාලය : ——————.
දිනය : ——————.

මෙම ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති විස්තර සත්‍ය බව ද, නිවැරදි බව ද, මම මෙයින් සනාථ කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැන ගැනීමට ලැබුණහොත්, ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද, මෙම තනතුරට, මා පත්කර ගැනීමෙන් පසුව එම වරද දැනගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව දනිමි.

මෙම විභාගයට අදාළ කොන්දේසි සියල්ල පිළිපැදීමට මම එකඟ වෙමි.

——————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : ——————.

## ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ..................................(සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත් ..................................දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් සහතික කරමි.

ඉහත 02 වැනි ඡේදයේදී ඇති විස්තර නිවැරදි බවත්/පහත සඳහන් කරුණු සංශෝධනය විය යුතු බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම ..................................බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදාහැරිය හැකිය/නොහැකිය.

..................................
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය ..................................
සහතික කරන නිලධාරියාගේ නම ..................................
තනතුර ..................................
ලිපිනය ..................................
(නිල මුද්‍රාව සහිතව සහතික කළ යුතුය.)

05-424

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.